# රාජ්‍ය දැව සංස්ථාව
# அரசாங்க மரக் கூட்டுத்தாபனம்
# STATE TIMBER CORPORATION



# 2024
# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

පාරිභෝගික විශ්වාසය දිනාගත් දැව කර්මාන්තයේ සැබෑ නායකත්වය
நுகர்வோரின் நம்பிக்கையை வென்ற அரிமரக் கைத்தொழிலில் உண்மையான தலைமைத்துவம்
**REAL LEADERSHIP OF THE TIMBER INDUSTRY THAT WON CONSUMBER TRUST**

පරිසර අමාත්‍යාංශය
சுற்றாடல் அமைச்சு
MINISTRY OF ENVIRONMENT



# රාජ්‍ය දැව සංස්ථාව

# වාර්ෂික වාර්තාව - 2024

## දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය උදෙසා

# 1968 - 2024

**56 වසරක නොනිමි ගමන් මග රාජ්‍ය දැව සංස්ථාව**

**ජන හද දිනූ ආයතනයක්**
**ලෙස පෙරටම**

## දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම.

## මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුනතාවය උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව, පරිසර හිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම.

# අනර්ඝතම දැවමය නිෂ්පාදන

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංකඃ 14796 දරණ ගැසට් පත්‍රය මගින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමා විසින් 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවන ලද අතර, 1969.11.07 දිනැති අංකඃ 14879 දරණ ගැසට් පත්‍රය, 1982.02.05 දිනැති අංකඃ 178/10 අති විශේෂ ගැසට් නිවේදන, 2001.06.26 දිනැති අංකඃ 1190/7 දරණ ගැසට් නිවේදන හා 2008.02.25 දිනැති අංකඃ 1538/7 දරණ ගැසට් නිවේදනය හා අංකඃ 2314/48 දරණ ගැසට් නිවේදන හා 2023.01.13 දිනැති ගැසට් නිවේදන මඟින් තවදුරටත් සංශෝධනය කර, යාවත්කාලීන කර ඇත. සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන 2.5 ක් වන අතර, ප්‍රධාන කාර්යාලය ශ්‍රී ජයවර්ධනපුර පිහිටා ඇත. වර්ෂ 56 කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතනවල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැනුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ගුණාත්මක බවින් යුතු අනර්ඝතම දැවමය නිෂ්පාදන පාරිභෝගිකයින් හට සැපයීමට හා උපරිම සේවාවක් ලබාදීමට හැකි සෑම අවස්ථාවකදීම උත්සාහ දරයි. අලංකාර නිවාස, සුඛෝපභෝගී හෝටල්, විධායක කාර්යාල ඇතුළු විදේශීය වාසස්ථාන සඳහා ද, අපගේ අනර්ඝ දැව ඉහළ වටිනාකමක් එක් කරයි. මනා ලෙස කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන වටිනා දැව මඟින් කරනු ලබන සුවිශේෂී නිෂ්පාදන වන කාර්යාල හා නිවාස සඳහා වූ ගෘහ භාණ්ඩ, කඳන් හා ඉරූ දැව අපගේ පාරිභෝගිකයන් උපරිම තෘප්තිමත්භාවයට පත්කිරීමට සමත් වේ. කීර්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව පුළුල් පරාසයක පැතිරුණ ඉහළ පෙළේ හා දීර්ඝ කල්පැවැත්මක් ඇති දැවමය නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන අතර, නිෂ්පාදන නවීන තාක්ෂණයෙන් යුතු අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණ වලින් සමන්විත නවීන වැඩ පරිසරයක් තුළ නිපදවනු ලබයි.

සිත්ඇදගන්නාසුළු අසුන්වල සිට සුවිශේෂී නිදන කාමර කට්ටලයන් දක්වා පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන මිළට හා කාල වකවානුව තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව, නිෂ්පාදන ලබාදීමේ හැකියාව රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අප විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගන්නා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග තුළින් සනාථ කරනු ලබයි.

- තිරසාරව කළමනාකරණය කරන ලද වනවගා මගින් ලබාගනු ලබන පරිණත දැව අපගේ නිෂ්පාදනයන් සඳහා යොදාගනු ලැබීම.
- ඵලය හා දෝෂ රහිත, ඉහළ ශ්‍රේණියේ දැව භාවිතා කරනු ලැබීම.
- මනා ලෙස පරිරක්ෂණය කරන ලද දැව භාවිතය.
- නවීන නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය.
- ගුණාත්මකභාවය සහ සහතික කරන ලද අනෙකුත් දැව නොවන අමුද්‍රව්‍ය භාවිතය.
- එකලස් කිරීමේ හා නිම කිරීමේ නවීන ශිල්පක්‍රම භාවිතය.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය හැරුණුවිට, සංස්ථාව මගින් සපුරාලනු ලබන සියලුම ආකාරයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතා සඳහා නොමිලේ ඇස්තමේන්තු කිරීමේ සේවාවක් සහ මිනුම් සේවාවක් සපයනු ලබයි. තවද, ඉහළ ප්‍රතිලාභ සහිත අපගේම පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කරන ලද උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ පරාසයක් වෙළෙඳපොළට සැපයීමට අපි සහතික වෙමු. අපගේ නිෂ්පාදන පරාසයන් පුළුල් කිරීමට අමතරව විශේෂයෙන් අපගේ සේවාවන් සහ ගනුදෙනුකරුවන් සඳහා සේවා පරිසරය ද අපි නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ද සහතික වෙමු.


# අපගේ කාර්යයන්



නිවාස හා සේවා ස්ථාන ඉදිකිරීම සඳහා තිරසාර දැවමය අමුද්‍රව්‍ය සැපයීම



තිරසාර වන කළමනාකරණ ක්‍රමෝපායන් යොදාගනිමින් පරිසරය ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමටත් දායක වීම



පුළුල් පරාසයක පැතිරුණ නවීන හා සම්ප්‍රදායක ගෘහ භාණ්ඩ සැපයීම



මූල්‍ය වශයෙන් ස්ථායී ආයතනයක් ලෙස දීර්ඝ කාලයක් පාරිභෝගිකයින් හට භාණ්ඩ හා සේවා සැපයීම



ආදායම් බදු හා භාණ්ඩාගාර බදු ගෙවමින් ප්‍රජා සංවර්ධනය සඳහා දායක වීම





# පටුන


| | පිටුව |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන විශේෂ දත්ත | 08 |
| ආයතනික තොරතුරු | 09 |
| කළමනාකරණ මඩුල්ල | 10-12 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 13-15 |
| සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය | 16-19 |
| අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම් | 20-21 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 22 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල | 23 |
| මෙහෙයුම් අංශයේ කාර්යභාරය | 24-26 |
| අපගේ ආවරණ කලාප | 27 |
| ආයතනික පාලනය | 28-30 |
| විගණන කමිටු වාර්තාව | 31-32 |
| අවදානම් කළමනාකරණය | 33-34 |
| මානව සම්පත | 35-36 |
| ආයතනික සමාජ වගකීම | 37-44 |
| ව්‍යාපාරික සාරාංශය | 45-47 |
| දශකයක තොරතුරු | 48 |
| විගණකාධිපති වාර්තාව | 49-58 |
| වාර්ෂික ගිණුම් | 59-81 |
| මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව | 82-83 |

# මූල්‍ය ප්‍රකාශන විශේෂ දත්ත

| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා | 2024 රු. '000 | 2023 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| **ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | |
| පිරිවැටුම | 3,981,154 | 4,092,128 | -3% |
| බදුවලට පෙර ලාභය | 824,720 | 1,273,734 | -35% |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | 346,773 | 649,461 | -47% |
| ආදායම් බදු | 29,091 | 117,943 | -75% |
| ආදායම් බදුවලට පෙර ලාභය | 795,628 | 1,155,791 | -31% |
| හිමිකම් මත ඉපැයීම් | 9.80% | 14.40% | -32% |
| වත්කම් මත ඉපැයීම් | 7.50% | 12.10% | -38% |
| **ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | |
| මුළු වත්කම් | 10,570,675 | 9,562,930 | 11% |
| මුළු හිමිකම් | 8,122,338 | 8,006,788 | 1% |
| මුළු ණය | 2,448,337 | 1,556,142 | 57% |
| ණය/හිමිකම් | 30% | 19% | 55% |
| ණය/මුළු වත්කම් | 23% | 16% | 42% |
| **වෙනත් තොරතුරු** | | | |
| මුළු සේවකයන් (සංඛ්‍යාව) | 1,315 | 1,390 | -5% |
| එක් සේවකයෙකුට ආදායම | 3,027.49 | 2,943.98 | 3% |
| එක් සේවකයෙකුට ලාභය (බදුවලට පෙර) | 627.16 | 916.36 | -32% |



# ආයතනික තොරතුරු - 2024-12-31

ගරු පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය - වනජීවී හා වනසම්පත් සංරක්‍ෂණ අමාත්‍යතුමිය

ආර්.එම්.සී.එම්.හේරත් මිය - ලේකම්, වනජීවී හා වනසම්පත් සංරක්‍ෂණ අමාත්‍යාංශය

### අධ්‍යක්‍ෂ මණ්ඩලය

බී.එස්. ගුණරත්න මහතා - සභාපති රාජ්‍ය දැව සංස්ථාව

ඊ.ඒ.පී.එන්. එදිරිසිංහ මහතා - අධ්‍යක්‍ෂ - වන සංරක්‍ෂක දෙපාර්තමේන්තුව

එච්.පී. කේ. පෙරේරා මහතා - අධ්‍යක්‍ෂ - මුදල් අමාත්‍යාංශය

සී. වික්‍රමරත්න මහතා - අධ්‍යක්‍ෂ

චන්දන පෙරේරා මහතා - අධ්‍යක්‍ෂ

කේ.ඒ.ඩී.එස්.සී.කේ. කතුරුසිංහ මහතා - අධ්‍යක්‍ෂ

ඊ.ආර්. කුලතුංග මහතා - අධ්‍යක්‍ෂ

ටී.ඩී. සමරවික්‍රම මිය - ලේකම්

එච්.එම්.එස්. මාධව මහතා - ලේකම්

### විගණන කමිටුව

| | | |
|---|---|---|
| එච්. පී. කේ. පෙරේරා මහතා | - | කමිටු සභාපති |
| චමින්ද වික්‍රමරත්න මහතා | - | කමිටු සාමාජික |
| චන්දන පෙරේරා මහතා | - | කමිටු සාමාජික |

### විගණක

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

### ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

### මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : +94-11-2866600-5

ෆැක්ස් : +94-11-2866623

වෙබ් අඩවිය : www.timco.lk

# කළමනාකරණ මඬුල්ල - 2024

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි/<br>ප්‍රධාන විධායක නිළධාරි | ආචාර්ය නිමල් රුවන්පතිරණ | Ph.D., M.Sc (Foresty),<br>B.Sc(Bio.Sc),<br>B.A.F.(Forest Mgt-Germany),<br>M.I.Bio.(SL) |

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

| | | |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) | ජී.ඩී.එස්. කුමාරසිංහ මයා | MBA, B.Sc. (Acc.Fin.Mgt),<br>FCA, ACCA, ACMA |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි<br>(මානව සම්පත් හා පාලන) | එම්.ඒ.සී.එන්. සමරසිංහ මයා | MPM, B.Sc (Business studies)<br>Ad.Dip in Mgt. and Admin |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) | පී.කේ. අජිත් චන්දන මයා | B.Sc (Hon.),<br>MBS,HRM.Dip |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) | ඩබ්.බී.සමන්ත මයා | MBM, M.Sc (Forestry), B.Sc,<br>N.Dip in (Teaching) |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි<br>(ඉංජිනේරු හා නිෂ්පාදන) | ජී.ජී.ටී.ගමගේ මයා | MBS, B.Sc (Physical Science) |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි<br>(අභ්‍යන්තර විගණන) | එච්.එම්.එස්. මාධව මයා | MPCM, PGD(Com), B.com<br>(Sp), Dip in internal Auditing |
| සහකාර සාමාන්‍යාධිකාරි (කලාප) | එච්.බී. රජවත්ත මයා | B.A, MBS |
| සහකාර සාමාන්‍යාධිකාරි<br>(පර්යේෂණ පුහුණු හා සංවර්ධන) | ආචාර්ය සී.කේ. මුතුමාල | PhD in Agricultural,<br>Engineering M.Sc. (Forestry),<br>B.Sc.(Agri.) Hon.<br>Dip. in English |

## කළමනාකරුවන්

| | | |
|---|---|---|
| කළමනාකාර (මුදල්) | පී.ටී.එන්. බෝවත්ත මිය | |
| කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) | ඒ.කේ. ලසිත එඩ්මන්ඩ් මයා | B.Sc. (Engineering) |
| කළමනාකාර (තොරතුරු තාක්ෂණ)<br>වැ/ආ | ඩබ්.එච්.ඒ. චන්ද්‍රකුමාර මයා | B.Sc. |
| කළමනාකාර (සිල්පර හා විදුලිකණු) | ඩී.එම්.එන්.පුෂ්පකුමාර තිල්මිණි මයා | B.Sc. (N.S) |
| කළමනාකාර (මුදල්) වැ.ආ | එස්.විතානගේ මිය | |
| කළමනාකාර (මුදල්) වැ.ආ | එස්.පී.ඒ.ජේ.සී.සමරකෝන් මයා | B.Sc. (Finance) Sp |

## ප්‍රාදේශිය කළමනාකාරුවන්

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකාර (බණ්ඩාරවෙළ) | ඩී.එච්. රාජපක්ෂ මයා | M.Sc (Forestry), B.Sc (Agri.) Sp |
| ප්‍රාදේශිය කළමනාකාර (මාතර) | ඩබ්.අයි. සාරංග මයා | B.Sc (Hon) |
| ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය) | ආර්. විජේතුංග මයා | B.Sc (Agri.) Sp |
| ප්‍රාදේශිය කළමනාකාර (ප්‍ර.කා) | එච්.පි.එස්. දිසානායක මයා | BA |
| ප්‍රාදේශිය කළමනාකාර (කුරුණෑගල) | යූ.එස්.එම්. ප්‍රනාන්දු මයා | BA (Sp),MBS |
| ප්‍රාදේශිය කළමනාකාර (අම්පාර) | යූ.පී.එච්. උළුවඩුගේ මයා | B.Sc |
| ප්‍රාදේශිය කළමනාකාර (කොළඹ) | එම්.ඩී.සී. සම්පත් මයා | BA |
| ප්‍රාදේශිය කළමනාකාර (රත්නපුර) | එච්.එල්. නන්දන මයා | B.Sc, MBS. |
| ප්‍රාදේශිය කළමනාකාර (නුවර) වැ/ආ | ඩී.ජේ. හෙන්දාවිතාරන මයා | Dip (Forest Technology) NVQ 05, MBS. |
| ප්‍රාදේශිය කළමනාකාර (නුවරඑළිය) | සුනිල් ජයරත්න මයා | |
| ප්‍රාදේශිය කළමනාකාර (අනුරාධපුර) වැ/ආ | ඩී.එල්. අබේනායක මයා | |
| ප්‍රාදේශිය කළමනාකාර (යාපනය) වැ/ආ | එම්.ඩබ්.ඩබ්.බී. මුදන්නායක මයා | BA |
| ප්‍රාදේශිය කළමනාකාර (මොණරාගල) | එස්.සී. ජයමාන්න මහතා | B.Sc |
| ප්‍රාදේශිය කළමනාකාර (බණ්ඩාරවෙල) | ආර්.සී. සමන් කුමාර මහතා | |

## නියෝජ්‍ය කළමනාකරුවන්

| | | |
|---|---|---|
| කළමනාකාර (නීති) | කේ.අයි.ඩී.පී කාරියවසම් මිය | LLB, Attorney at Law |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ හා තත්ත්ව ආරක්ෂණ) කල්දෙමුල්ල | ඊ.එම්.එම්. ප්‍රනාන්දු මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) බූස්ස | ඒ.එල්. තුෂාරි ද සිල්වා මිය | HNDA, MAAT |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවරඑළිය | එන්.ටී.එස්.කේ.පී. තිලකවර්ධන මයා | HNDA, MAAT |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවර | ඩබ්.එම්.ජී.එම්. විජේසිංහ මයා | B.Sc. (Bus.Admin.) MAAT |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මාතර | ඒ.ජේ.පුෂ්පකුමාර මයා | B.Sc. (Bus.Admin) MA |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මින්නේරිය | එම්.ඩී.පී.එම්. දිසානායක මිය | B.Sc. (Acc), MBS |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) අනුරාධපුර | ඩබ්.කේ. ජයසිංහ මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) (කුරුණෑගල) | එස්.එච්.අයි. ප්‍රසාද් මයා | B.Sc, Bus.Admin. (Bus.Econ.sp),MBS |
| නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍ර කා | ඩී.කේ.ජී.ජී. පුෂ්පකුමාර මයා | B.Com., MBA, MAAT, PgD.Acc. & Fin. |
| නියෝජ්‍ය කළමනාකාර (අලෙවි) | ඩබ්.ඩී.ජේ.එස්. තිලකරත්න මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (දැව ශ්‍රේණිකිරීම් හා වෙන්දේසි) | ඩී.පී.කේ.එස්.ජී. සමරවික්‍රම මයා | B.Sc (Mkt.Mgt) |

| | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර (දැව සැපයීම්) | බී.ඒ. නලින් දේශප්‍රිය මයා | |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ) | එච්.එම්.ටී.එස්. අබේරත්න මිය | MBA, B. Design (Hon), |
| නියෝජ්‍ය කළමනාකාර (ඉරුම්හල්) | එම්.පී.එන්. අරුණ ශාන්ත මයා | B.Sc (Bus.Admin) |
| නියෝජ්‍ය කළමනාකාර (විමර්ෂන) | එස්.ඒ.ඩී. නිරෝෂන් මයා | B.Sc (Bus.Mgt) |
| නියෝජ්‍ය කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) - කල්දෙමුල්ල | එම්.කේ.එම්. අත්හර් මයා | B.Tech |
| නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) | ඩබ්.එම්.අයි.එච්. වීරසූරිය මයා | B.Sc |
| නියෝජ්‍ය කළමනාකාර (සිවිල් ඉංජිනේරු) | ජේ.ආර්.ඩී.එස්. ජයලාල් මහතා | Dip (Technology Programme Computer Awareness Programme |
| නියෝජ්‍ය කළමනාකාර (මානව සම්පත්) | කේ.පී.ආර්.එන්.එස්. නවරත්න මිය | B.Sc (HRM) Sp |
| නියෝජ්‍ය කළමනාකාර (දැව පදම් කිරීම් හා පරිරක්ෂණ) | සී.අයි.එම්. ආරච්චි මිය | B.Sc (Sp) |
| නියෝජ්‍ය කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) වැ/ආ | ආර්.යු. සේනාරත්න මිය | B.Sc in Logistic Management (Sp in Transportation Management) |

## ගෘහභාණ්ඩ සංකීර්ණ කළමනාකරුවන්

| | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර) කල්දෙමුල්ල | එච්.එම්.යු.පී. සෝමවීර මයා | BLE, Dip IT & Mgt |
| නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා සංකීර්ණය) අම්පාර | ආර්.එස්. පල්ලියගේ මයා | B.Sc (Bus.Admin) |
| නියෝජ්‍ය) කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) බූස්ස | එච්.එම්.එල්.ඊ.ගුණසේකර හේරත් මයා | B.Sc |

## නියෝජ්‍ය ප්‍රාදේශිය කළමනාකරුවන්

| | | |
|---|---|---|
| නි.ප්‍රා.ක. (නුවර) | ඩබ්.ඩී.පී.ජී.ජයසේකර | |
| නි.ප්‍රා.ක. (මින්නේරිය) | කේ.එම්.පී.ටී.සී. කපිලරත්න මයා | |
| නි.ප්‍රා.ක. (අම්පාර) | යු.ජේ.ජී. ඒකනායක මයා | |
| නි.ප්‍රා.ක. (කොළඹ) | එස්.බී. උඩගෙදර මයා | BA |
| නි.ප්‍රා.ක. (මාතර) | පී.හෙට්ටිආරච්චි මයා | B.Sc |
| නි.ප්‍රා.ක. (රත්නපුර) | එස්.ඒ මනෝජ් තුෂාර මයා | |
| නි.ප්‍රා.ක. (කුරුණෑගල) | ආර්.පී.පී.ඩී. ජයසිංහ මයා | |
| නි.ප්‍රා.ක. (අනුරාධපුර) | එස්.එම්.එස්. සිරිවර්ධන මයා | |





# සභාපතිතුමාගේ සමාලෝචනය

**මහාචාර්ය කේ.පී.එල්. නිශාන්ත පටබැඳි**
**සභාපති**

රාජ්‍ය දැව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එළිදක්වන්නට අවස්ථාව ලැබීම ඉමහත් සතුටට කරුණකි. රාජ්‍ය දැව සංස්ථාව දශක හයකට ආසන්න සේවා ඉතිහාසය පුරාවට ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු ලෙස පුරෝගාමී නායකත්වයක් උසුලනු ලැබ තිබේ. සංස්ථාවේ නොසැලෙන කැපවීම සහ දරාගැනීමේ හැකියාව හේතුවෙන් විවිධ අභියෝග හමුවේ වුවද මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් විශිෂ්ඨත්වය අඛණ්ඩව පෙන්නුම් කර ඇත.

මේ සඳහා 2024 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිවරුන් දෙදෙනෙකුගේ දායකත්වයන් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ලබාදී ඇත. ඒ අනුව 2024.01.01 දින සිට 2024.10.31 දක්වා බී.එස් ගුණරත්න මහතාගේ ද නායකත්වය සංස්ථාව වෙත ලබාදී ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ කාර්ය සාධනයට ප්‍රබලව බලපාන සාධක අතර වන කලමනාකරණය පිළිබඳ ආර්ථික, සමාජීය, දේශපාලනික සහ ජීව විද්‍යාත්මක පසුබිම තේරුම් ගැනීම, එම අංශ සමබර කරගැනීම, අවධානම් සහිත සහ අභියෝගාත්මක වුවද විධිමත් කලමනාකරණය තුළින් අනාගත දැව සැපයීම ස්ථාවර මට්ටමක පවත්වාගත හැකි බව රාජ්‍ය දැව සංස්ථාව ප්‍රායෝගිකව ඔප්පු කර ඇත. වෙනත් භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම මෙන් නොව දැව භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ආර්ථික මෙන්ම පරිසරය සමඟද සංවේදී වේ. එම නිසා අමුද්‍රව්‍යවල හිඟතාව හා අධික පිරිවැය නිසා රාජ්‍ය දැව සංස්ථාව ලාභදායීත්වය පිළිබඳ අභියෝගතාවයන්ට මුහුණ පෑමට සිදුව තිබේ.


2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වර්ෂය පුරා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන්, සංස්ථාවේ ආදායම රු. 3,981,154,984 හා බදු සහ රජයේ භාණ්ඩාගාර බදු ගෙවීමෙන් පසු ලාභය රු. 448,854,943.00 ලෙස සැලකිය යුතු ආදායමක් සහ ලාභාංතිකයක් ලබා ගැනීමට හැකිව තිබේ. තවද, ආර්ථික හා මූල්‍ය අභියෝග මධ්‍යයේ රාජ්‍ය දැව සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු මධ්‍යස්ථව පවත්වාගෙන යෑමට සමත්ව ඇත. මුදලේ අගය අවප්‍රමාණය වීම, උද්ධමනය සහ පොලී අනුපාත උච්ඡාවචනය වීම වැනි අභියෝග අප ආයතනය කෙරහිද තදින් බලපෑ කරුණු අතර විය.

සංස්ථාව සතු වටිනාම සම්පත වන්නේ මානව සම්පත බව අපගේ විශ්වාසයයි. 2024 කාල පරිච්ඡේදය තුලදී පෙර වර්ෂ මෙන්ම අප සංස්ථාව විසින් මානව සම්පත පුහුණු හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුලින් කුසලතා හා දක්ෂතා වැඩිදියුණු කොට පාරිභෝගිකයන්ට කාර්යක්ෂම හා උපරිම සේවයක් සැපයීම මෙන්ම ආයතනයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කටයුතු කර ඇත. තවද ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේ දී රාජ්‍ය අංශයේ නිෂ්පාදන අංශය වෙනුවෙන් රන් සම්මානය 2024 වසර තුල ලබා ගැනීමට හැකිවීම රාජ්‍ය දැව සංස්ථාව ලද විශේෂ ජයග්‍රහණයකි.


**මූල්‍ය කාර්ය සාධනය**

2024 වසරේ පැවති ආර්ථික අසමතුලිතතා මත වුවද, 2024 මූල්‍ය වසරේදී රු. මිලියන 3,981 ක ආදායමක් වාර්තා කළ අතර, 2023 වසරේ වාර්තා වූ රු. මිලියන 4,092 ට සාපේක්ෂව 2.7% ක අඩු වීමක් සිදුවී ඇත. එහෙත්, මෙම පසුබැසීම තුළ හෝ, බදු පෙර ලාභය රු. මිලියන 824 ක් සහ 2024 වර්ෂයේ බද්දෙන් පසු ලාභය රු. මිලියන 795 ක් ලෙස වාර්තා කිරීමට සමත්ව ඇත.

බදු පෙර ලාභය සහ බදු පසු ලාභය 2023 වසරට සාපේක්ෂව පිළිවෙලින් 35% කින් සහ 31% කින් අඩුවී තිබේ. තවද රාජ්‍ය ආයතනයක් ලෙස මෙම අසීරු කාලසීමාව තුල වුවද 2024 වසරේ රු. මිලියන 346 ක් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබා දීමට රාජ්‍ය දැව සංස්ථාව සමත්ව ඇති බව ආඩම්බරයෙන් සඳහන් කළ හැකිය.




එසේම, බදුවලට පෙර සංස්ථාවේ සාමාන්‍ය වත්කම් ප්‍රතිලාභ අනුපාතය (ROA) 2023 වසරේ 13% සිට 2024 වසරේ 7% දක්වා පහල ගොස් ඇත. බදුවලට පසු සාමාන්‍ය කොටස් ප්‍රතිලාභ අනුපාතය (ROE) 2023 වසරේ 15% සිට 2024 වසරේ 10% දක්වා පහල ගොස් ඇතත් ආයතනය නිවැරදි කාර්යභාරය තුලින් මූල්‍ය කලමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමට හැකිවී ඇත.




**ඉදිරි පියවර**

රාජ්‍ය දැව සංස්ථාවේ ව්‍යාපාර ස්වභාවය අනුව, තවදුරටත් තිරසාර ලෙස ආරක්ෂාකාරීව සහ නිරෝගීව පත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව මම විශ්වාස කරමි. අපගේ ශක්තිමත් සංවිධානාත්මක හැකියාවන් නිසා ඉදිරියේදී තවත් බොහෝ අවස්ථාවන් ලබාගත හැකිවනු අතර, මුහුණ දෙන තරගකාරීත්ව අභියෝග පිළිබඳව නිවැරදිව අවධානයෙන් සිටිමින් ඒ සඳහා නව සංවර්ධන ප්‍රාග්ධන පියවර ගනිමින් සිටිමු.

අභියෝගාත්මක උපාය මාර්ගික සැලැසුම් සකස් කර එම සැලසුම් ක්‍රියාත්මක කරමින්, අතරමැද එය සමාලෝචනය කරමින් නව සැලසුම් සකස් කරමින් ඉතාමත් ශක්තිමත් පදනමක් මත ව්‍යාපාර අභියෝග හමුවේ වුවද ගමන් කළ හැකි බව අපි විශ්වාස කරමු.

මම විශ්වාස කරනුයේ රාජ්‍ය දැව සංස්ථාව අභියෝගයන්ට මුහුණ දීමට සූදානම්ව සිටින, සිය ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා අවස්ථා සොයා ගැනීමට හැකියාව ඇති ආයතනයක් බවයි. එසේම, සිය කීර්තිමත් වෙළඳනාමය තවදුරටත් ව්‍යාප්ත කිරීමට සහ ආයතනයට අදාළ අනෙකුත් සාධක

ශක්තිමත් කිරීමට නිරන්තරව බලාපොරොත්තු සහගතව සිටින බවයි.

රාජ්‍ය දැව සංස්ථාව ඉදිරියටත් සිය වටිනාකම් වැඩි කරගනිමින් උනන්දු වීම මඟින් කාර්ය සාධනය ගොඩ නැගීමට කටයුතු කරමින්, ආරක්ෂාකාරීව ඉදිරියට යනු ඇත. එසේම, වර්තමාන රජයෙන් ලබා දෙන අනුග්‍රහයන් මත දේශීය නිෂ්පාදනයන් වර්ධනය කර ඒවා අපනයනය කිරීමට ද උත්සහවන්තව කටයුතු කරන්නෙමු.

**ස්තූතිය**

ගරු පරිසර අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමන්, ලේකම්තුමන් සහ පරිසර අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, වන සංරක්ෂණ ජනරාල් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, මහජන ව්‍යාපාර දෙපාර්තමේන්තුව, කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඇතුළුව අනෙකුත් සියලුම රජයේ නිලධාරීන් අප වෙත ලබා දුන් විශාල සහයෝගය පිළිබඳව හෘදයංගම ස්තූතිය පළකරමි. රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙතද ඔවුන්ගේ දැනුම සහ කුසලතා රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් කැපකිරීම වෙනුවෙන් ද විශේෂයෙන්ම ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම වෙනුවෙන් ද විශේෂ ස්තූතිය පළකරමි. 2025 වසර අපගේ ඉලක්ක සපුරා ගැනීම පහසු නොවන නමුත්, අප කෙටි කාලීන අභියෝගයන් නොසලකා දිගු කාලීන අරමුණු පසුපස යමින්, හැකිතාක් හොඳම ප්‍රතිඵල ලබා දීමට යොමු වෙමු. අපගේ ඉලක්ක සපුරාගැනීමට දායකත්වය ලබාදුන් සියලුම පාරිභෝගිකයන්ට මෙන්ම, අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත ස්තූතිය පළකරමි.

නව රජයේ ප්‍රතිපත්තිය වන **"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්"** සංකල්පය සියලු ශ්‍රී ලාංකික ප්‍රජාව උදෙසා යතාර්ථයක් බවට පත්කිරීමට රජයට ජවය සපයන ප්‍රමුඛතම රාජ්‍ය ව්‍යවසාය ආයතනය වශයෙන් ඉදිරියේදී රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරනු ඇති අතර, දැව වෙළඳපොලේ පෙරට වඩා ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයෙකු බවට පත්වනු ඇතැයි මා තරයේ විශ්වාස කරමි. අවසාන වශයෙන් සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය තවදුරටත් රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් බලාපොරොත්තු වෙමි.

**මහාචාර්ය කේ.පී.එල්. නිශාන්ත පටබැඳි**
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව.

# සාමාන්‍යාධිකාරී සමාලෝචනය



**ආචාර්ය එන්. ඩී. රුවන්පතිරණ**
**සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී**

රාජ්‍ය දැව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා ඉමහත් සතුටට පත්වන අතර, වාණිජ මෙහෙයුම් සම්බන්ධයෙන් වසර 56 ක පළපුරුද්ද සමග 2024 වර්ෂය තුළදීත් පෙර වර්ෂවල මෙන්ම අභියෝග හමුවේ නොසැලී ඉතා සාර්ථකව ජයග්‍රහණ රැසක් සමඟින් ප්‍රශංසනීය කාර්ය සාධනයක් සනිටුහන් කිරිමට හැකිවීම පිළිබඳව රාජ්‍ය දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස මා ලද සුවිශේෂී වරප්‍රසාදයක් ලෙස මම දකිමි.

අප විසින් ඉතාමත් අනර්ඝ තත්ත්වයේ දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිපදවා, එම භාණ්ඩ සාධාරණ මිලකට සපයන අතර, නිත්‍ය පාරිභෝගිකයන් මෙන්ම නව පාරිභෝගිකයන් ද, අපගේ සේවය පිළිබඳ අතිශය තෘප්තිමත් බව කිව යුතුමය. වර්තමානයේ දැව නිෂ්පාදනය සඳහා ලොව පවත්නා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ සැපයීමෙහි පුරෝගාමියෙකු වශයෙන් දැව නිෂ්පාදන කර්මාන්තය ඔසවා තැබීම සඳහා රාජ්‍ය අංශයේ එකම දැව නිෂ්පාදකයා වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් කර්තව්‍යයක් අඛණ්ඩව සිදුකරනු ලබයි.

එසේම රටේ පැවති ආර්ථික තත්ත්වය හා සමාජීය දුෂ්කරතා මධ්‍යයේ ද ඕනෑම අභියෝගාත්මක තත්ත්වයකට මුහුණ දෙමින් ඉදිරියේදී ද නොපසුබට උත්සාහයෙන් යුතුව නැගීසිටීමට අප සතුව ඇති සූදානම පිළිබඳව නිහතමානී ආඩම්බරයකින් යුතුව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

**මෙහෙයුම් කාර්ය සාධනය**

රාජ්‍ය දැව සංස්ථාවේ දැක්ම සහ මෙහෙවරට අනුකූලව, ගුණාත්මක දැව සහ දැව පදනම් කරගත් නිෂ්පාදන දැරිය හැකි මිලකට සැපයීමේ ජනතා අපේක්ෂාවන් සපුරාලීම අපගේ ප්‍රමුඛ කාර්යයයි. ශ්‍රී ලංකාවේ ගුණාත්මක බවින් ඉහළ ආර්ථික වටිනාකමක් සහිත සාර්ථක වන වගාවන් පවත්වාගෙනයාම අසීරු කටයුත්තක් වී ඇත. එබැවින් තරඟකාරී විදේශ දැව වෙළෙඳපොළ වෙත දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයීම රාජ්‍ය දැව සංස්ථාවට තවදුරටත් විශාල අභියෝගයක් විය.

සංස්ථාව ආරම්භයේ සිටම රාජ්‍ය දැව සංස්ථාවේ මෙහෙයුම් ක්‍රියාවලිය රඳාපවතින්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වනවගා සඳහා මුදාහරින වනවගාවන් මෙන්ම, වන අපරාධ දැව සහ රජයේ ආයතන මඟින් ලබාදෙන පරිත්‍යාග දැව මතය. මෙම දැව ප්‍රභවයන් භාවිතා කරමින් රාජ්‍ය දැව සංස්ථාව විසින් කඳන්, ඉරුදැව, සිල්පර, අලිවැටකණු, විදුලි සම්ප්‍රේෂණ කණු, වැටකණු හා ගෘහ භාණ්ඩ වැනි විවිධ දැව ආශ්‍රිත නිෂ්පාදනයන් නිපදවනු ලබයි. වාර්ෂිකව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැව හෙළීමට නිදහස් කරන වන වගා ප්‍රමාණය සීමාවීම හේතුවෙන් ජාතික දැව ඉල්ලුමෙන් රාජ්‍ය දැව සංස්ථාව වෙතින් සැපයිය හැකි දැව ප්‍රමාණය 7% ක් පමණ වේ. වැඩබිම් ආශ්‍රිත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සහ මිනිස් ශ්‍රමය ලබාදීමෙන් මෙහෙයුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම රාජ්‍ය දැව සංස්ථාවෙහි අපේක්ෂාවයි. එහෙත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් මත නව බඳවා ගැනීම් නවතා ඇත.

2024 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හෙක්ටයාර් 556.78 ක් වන වගාවන් අස්වැන්න ලබා ගැනීම සඳහා ලැබී ඇත. එයින් හෙක්ටයාර් 212.80 ක් තේක්ක වගාවන් විය. ශ්‍රී ලංකාවේ තේක්ක නිෂ්පාදන සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් ඉදිරියේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තේක්ක වගාවන් වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට අපි උත්සාහ කරමු. කෙසේ වෙතත් 2024 දී රාජ්‍ය දැව සංස්ථාව විසින් කඳන් 87176m$^3$, ඉරු දැව 2456 m$^3$, විදුලි සම්ප්‍රේෂණ කණු 1637, සිල්පර 27840, අලි වැටකණු 5042, වටකණු 55731, වැට කණු 35742 ක් සහ දර 51249 m$^3$ නිෂ්පාදනය කරන ලදී. තවද, රාජ්‍ය දැව සංස්ථාවෙහි 2024 වසරේදී ගෘහ භාණ්ඩවල නිෂ්පාදන වටිනාකම රු. මිලියන 288 කි.

දැව කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස ගුණාත්මක දැව ලබා දෙමින් අනෙකුත් දැව කර්මාන්තවලට සහයවීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකි විය. තවද, අපගේ නිෂ්පාදන නිතරම බලාපොරොත්තු වන අපගේ වටිනා පාරිභෝගිකයින්ට උසස් නිමාවෙන් යුත් අලංකාර, වටිනා ගෘහභාණ්ඩ සැපයීමට අප බැඳී සිටී. එම හොඳම තත්ත්වයේ නිෂ්පාදන ලබා දීමෙන් අප ඔවුන්ගේ විශ්වාසය ආරක්ෂා කර ඇත. එසේම, අපගේ නිෂ්පාදන සඳහා කැපී පෙනෙන අගයක් එක් කිරීමට සංස්ථාවේ ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර සඳහා ISO තත්ත්ව සහතිකය අප ලබාගෙන ඇත.

**මූල්‍ය කාර්ය සාධනය**

රාජ්‍ය දැව සංස්ථාවට 2024 වසරේදී රු. මිලියන 3,981 ක ආදායමක් උපයා ගැනීමට හැකි විය. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අනුව බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 824 ක් වූ අතර, බද්දෙන් පසු ලාභය රු.මිලියන 795 ක් විය. 2023 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ බදු පෙර ලාභය රුපියල් මිලියන 1,273 කි. ඒ අනුව පෙර වසරට සාපේක්ෂව ලාභය 35% කින් පමණ අඩුවී ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දැව ලබාගැනීම සඳහා විකුණුම් මිලෙන් 60% - 65% ක් අතර ප්‍රමාණයක් ස්කන්ධභාගය ලෙස රාජ්‍ය දැව සංස්ථාව විසින් මහාභාණ්ඩාගාරය වෙත ගෙවා ඇත. එසේම රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පසුගිය කාලයේ යම් පසුබෑමක් පැවති අතර ඒ හේතුවෙන් දැව සඳහා පාරිභෝගිකයන්ගේ ඉල්ලුම ද විශාල ලෙස අඩු විය. එවැනි පසුබිමක අපගේ පිරිවැය ආවරණය කරගැනීම සඳහා නිෂ්පාදනයන්හි මිල වැඩිකිරීමකින් තොරව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත ලබාදීමට දැඩි වෙහෙසක් ගත්හ.

මෙම විශිෂ්ඨ ජයග්‍රහණය සම්පූර්ණයෙන්ම වියදම් පාලනය කිරීම සහ නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමෙන් තොරව දැනට සිටින සේවකයන්ගේ කාර්යක්ෂමතාව ඉහළම මට්ටමක පවත්වා ගැනීමේ ප්‍රතිඵලයකි. ආයතනයේ පුරප්පාඩු 800 කට ආසන්න ප්‍රමාණයක් ඇති වුවද, නව බඳවාගැනීම් නතර කළ අතර, ජීවන වියදම් ඉහළ යෑම හේතුවෙන් විදේශ රැකියාවන් සඳහා යෑම පිණිස ඉල්ලා අස්වීම් සිදුවීමත් සමඟ සේවකයින් ප්‍රමාණය අවම මට්ටමට පැමිණියේය. එබැවින්, රාජ්‍ය දැව සංස්ථාව බොහෝමයක් කටයුතු කරනු ලැබුවේ දැනට සිටින සීමිත කාර්ය මණ්ඩලය වෙත අමතර කාර්යයන් පැවරීම මඟිනි.

රාජ්‍ය ආයතනවල ඵලදායීතාව වැඩිකර ගැනීමට සේවක කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදය අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව යමින්

රාජ්‍ය දැව සංස්ථාව 2024 වසරේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ප්‍රාදේශීය කළමනාකරුවන් ඇගයීමට ලක් කරන ලදී. රාජ්‍ය දැව සංස්ථා ප්‍රාදේශික ඇගයීමේ මෙම ක්‍රමවේදය රාජ්‍ය දැව සංස්ථාවේ ඵලදායීතාව වැඩි කිරීම සඳහා මූලික හේතුවක් වූ අතර, අනෙක් සේවකයින් සඳහා අභිප්‍රේරණයක්ද විය. රාජ්‍ය දැව සංස්ථාව දිවයින පුරා ක්‍රියාත්මක ප්‍රාදේශීය කාර්යාල 10 ක්, දැව ගබඩා 47 ක්, ප්‍රදර්ශනාගාර 09 ක් නිෂ්පාදන සංකීර්ණ 03 ක් සහ ගෘහ භාණ්ඩ කර්මාන්ත ශාලාවන් 03 ක් සහිත ක්‍රියාකාරි මෙහෙයුම් ජාලයකින් සමන්විත වේ.

ආයතනයේ කළමනාකාරීත්වය හා සේවකයන්ගේ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතික වාණිජ මණ්ඩලය පිරිනමන ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා රන් සම්මානයෙන් රාජ්‍ය දැව සංස්ථාව 2024 වසරේ දී පිදුම් ලබන ලදී. මෙම සම්මානය ලැබීම සඳහා අපගේ ප්‍රධාන ක්ෂේත්‍ර වන මෙහෙයුම්, මූල්‍ය, අලෙවිකරණ සහ මානව සම්පත්හි කාර්යයන් අභියෝගාත්මක තත්ත්වයන් මැද වුවද විශිෂ්ඨ ජයග්‍රහණය කරා ගෙන ගියහ.

**සමාජ වගකීමේ (CSR) ක්‍රියාකාරකම් සඳහා දායකත්වය**

රාජ්‍ය දැව සංස්ථාවෙහි ප්‍රාදේශික 10 තුළ පැළ තවාන් 28 ක් පවත්වාගෙන යන අතර, වටිනා දැව සහ අනෙකුත් වනාන්තර ස්වභාවය මත අවශ්‍ය පැළ නිපදවා ගනී. පර්යේෂණ සංවර්ධන සහ පුහුණු කිරීමේ අංශය මඟින් රජයේ සහ පෞද්ගලික නොවන සංවිධාන වෙත මෙම පැළ නොමිලේ බෙදා හැරේ. රාජ්‍ය දැව සංස්ථාව දේශීය දැව කර්මාන්තය සුරකීම සහ ජෛව විවිධත්වය වර්ධනය කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් හරහා දැව වර්ග ජනප්‍රිය කිරීමේ අරමුණ ඇතිව කාබන් තිරකිරීම් වැඩි කිරීම, ගස් ගහනය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම මඟින් දේශගුණික වෙනස්කම් මැඩ පවත්වා ගැනීමට කටයුතු කරයි. රාජ්‍ය දැව සංස්ථාව දැව තිරසාර ලෙස භාවිතා කිරීමට දායකවීම සඳහා Sustainable Development Goals (SDGs) සමඟ වගකීම් සහිතව බැඳී සිටී.

එමෙන්ම රාජ්‍ය දැව සංස්ථාවෙහි සේවකයන් තම විෂයය ඵලදායී ලෙස කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ඊට අදාල පුහුණුවීම් පිළිබඳව නිතර අවධානය යොමු කරනු ලබයි. 2024 වසරේදී සේවකයන් 580 ට අවශ්‍ය පුහුණු වැඩසටහන් 51ක් සිදු කර ඇත. එමෙන්ම බාහිර පාර්ශවද සම්බන්ධ කරගනිමින් වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. එසේම, දැව තාක්ෂණික පුහුණු ආයතනය (TTTI) විසින් NAITA අපේක්ෂකයන් සහ ඇගයීම් කමිටුව වෙත ඔවුන්ගේ එම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා මෙවලම්, උපකරණ සහ ස්ථානය ලබා දීමෙන් උපකාර කර ඇත. එසේම දැව ක්ෂේත්‍රයට අදාලව NVQ වැඩසටහන්ද පැවැත්වූ අතර, දැව ශිල්පියාගේ කාර්යයන්ට වඩාත් උසස් කුසලතාවයක් ලබාදීමට එය උපකාර විය. ඊට අමතරව, 570 ක් පමණ පුහුණුලාභීන් බාහිර පුහුණු වැඩසටහන් හරහා පුහුණු කරනු ලැබූහ. රාජ්‍ය දැව සංස්ථාවෙහි පර්යේෂණ සහ පුහුණු අංශය ආයතනයේ ව්‍යාපාරික අවශ්‍යතා මෙන්ම, නව දැනුමට අනුව ඊට අදාල සමාජ ගැටළු පිළිබඳව ද පර්යේෂණ කටයුතු සිදු කරයි.

රාජ්‍ය දැව සංස්ථාව නව දැනුම බාහිර සමාජයන් සමඟ බෙදා ගැනීම සඳහා පර්යේෂණ, සම්මන්ත්‍රණයන් සහ ලිපි ප්‍රකාශනය කිරීම හරහා ක්‍රියාකරයි. 2024 වසරේදී සමස්තයක් ලෙස පර්යේෂණ පත්‍රිකා 6 ක් ප්‍රකාශයට පත් කරන ලදී. එසේම, දැව ආරක්ෂාකාරීව භාවිතා කිරීම සහ වාණිජ වනවගා ජනප්‍රිය කිරීම සඳහා ප්‍රදර්ශනවලදී සක්‍රීයව මඟපෙන්වනු ලැබීය. 2024 වසරේදී රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශන 4 ක් සඳහා දායක විය.

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු අංශයේ ප්‍රධාන කාර්යයන් අතර දැව වර්ග හඳුනා ගැනීම සඳහා නවතම තාක්ෂණය භාවිතා කිරීම, දැවවල පටක විද්‍යාත්මක ලක්ෂණ උපයෝගී කරගනිමින් දැව නිවැරදිව හඳුනාගැනීම සිදුකරන අතර, දැවවල ශක්ති ගුණාංග පරික්ෂා කර වාර්තා ලබාදීම මෙන්ම දැව තුළට පරිරක්ෂක කාවැදීම පිළිබඳ පරීක්ෂණ වාර්තා ඇතුළු තත්ත්ව වාර්තා ලබාදීම සිදුකරයි. 2024 වසරේදී රජයේ සහ පෞද්ගලික සංවිධාන සඳහා දැව සහතික පත්‍ර 189 ක් නිකුත් කරන ලදී.

**ආයතනික දැක්ම**

ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට උරදෙමින් 1621 කට අධික සේවක

සංඛ්‍යාවකට රැකියා අවස්ථා සලසා දෙමින් ජාතික මෙහෙවරක් ලෙස සලකා ක්‍රියා කිරීමට අපි වගබලා ගත්තෙමු. ආයතනයේ ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු හමුවේ නිවැරදි තීන්දු තීරණ නිසි කලට ගැනීම තුලින් විසඳාගත් බොහෝ ගැටළු ආයතනයේ සංවර්ධනයට හේතු සාධක විය. අභියෝග හමුවේ නොසැලී සිටීමේ හැකියාව කියාපාමින් කළමනාකාර මඬුල්ල මෙන්ම සේවකයන් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දු තීරණ හා එක්ව මැනවින් කටයුතු කිරීම අගය කළ යුතුය.

රාජ්‍ය දැව සංස්ථාවෙහි සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළ පසුගිය වසර 6 තුළ ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් රුපියල් බිලියන 6 කට ආසන්න මුදලක් ආයතනය නමින් තැන්පත් කර ඇත. සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරී ලෙස මෙය මාගේ ජයග්‍රහණයක් ලෙස සලකමි.

**ස්තුතිය**

පසුගිය වසර 6 තුළ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස මා අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම් හා උපදෙස් මත උපරිම ලෙස කටයුතු කල අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය ප්‍රකාශ කරමි. සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් කැපවීම සඳහා මාගේ ගෞරවය පළකිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම, අපගේ පාරිභෝගිකයන් වෙතද මාගේ ස්තුතිය පළකරමි, මන්ද ඔවුන් අපගේ දැව සහ දැව-මූලික නිෂ්පාදන සඳහා විශ්වාසනීයභාවයක් ඇති කරනු ලැබිය. අපි ඔවුන්ට විශේෂ වූ නිෂ්පාදන ලබා දීමට සූදානම්ව සිටිමු.

එසේම පරිසර අමාත්‍යතුමාට, අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ස්තුතිය පළකරමි. තවද, වන සංරක්ෂක ජනරාල්තුමන් සහ වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට, ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සඳහා මාගේ ගෞරවය පළකරමි. රාජ්‍ය දැව සංස්ථාවේ සමස්ථ කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ගෞරවනීය ස්තුතිය පළකරමි. ඔවුන්ට ප්‍රමාණවත් පහසුකම් නොතිබුණද, විශාල අභියෝග පැවතිය ද නොසැලී සේවය කිරීම, ඔවුන්ගේ කැපවීම, ආයතනයට දක්වන ආදරය, නවෝත්පාදන ක්‍රියාවලිය සහ නොනවතින උත්සහයෙන් යුතුව කටයුතු කිරීම රාජ්‍ය දැව සංස්ථාව මෙන්ම, රට වෙනුවෙන් ද සේවය කිරීමක් වන බව අපි විශ්වාස කරමු.

මෙම තරඟකාරී වෙළඳපොළ තුළ සෑමවිටම අප කෙරෙහි විශ්වාසය තබා අපගේ තත්ත්වය ඉහළම මට්ටමේ තබාගැනීමට ශක්තියක් වන අපගේ වටිනා පාරිභෝගිකයින් හට අපගේ ස්තුතිය ප්‍රකාශ කිරීමට මම අවසාන වශයෙන් කැමැත්තෙමි.



**ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ**
සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිළධාරි
රාජ්‍ය දැව සංස්ථාව



# අපගේ කාර්යභාරයන්

- වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.
- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.
- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
- දැව ආනයනය කිරීම.
- වන වගාවල ව්‍යාපෘති ආරම්භ කිරීම. නැවත වනවගා කිරීම. කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.
- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.
- පෞද්ගලික ඉඩම්වලින් දැව මිලදී ගැනීම හා ගබඩා හෝ මාර්ගාසන්නයේ තබා අලෙවි කිරීම.
- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.
- වේවැල් ආනයනය කිරීම.
- නියැදි පරීක්ෂා කිරීම් මඟින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.
- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැළසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.
- වනසංරක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය මත කලුවර දැව ප්‍රධාන දැවය ලෙස යොදානොගත් සහ නිර්මාණ අලංකරණය සඳහා පමණක් කලුවර දැව යොදාගෙන ඇති ගෘහභාණ්ඩ අපනයනය කිරීම.
- දැව භාණ්ඩ දැවමය ගෘහභාණ්ඩ හා දැවමය කලාත්මක නිෂ්පාදන පුද්ගලික අංශයෙන් මිලදීගැනීම හා අලෙවි කිරීම.
- විදේශ ප්‍රදර්ශනාගාර හිමි ව්‍යාපාරික ආයතන සමග එළැඹෙන ලද ගිවිසුම් යටතේ ගෘහභාණ්ඩ අපනයන කිරීම.
- අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරන ලද විධාන සැලකිල්ලට ගනිමින් රාජසන්තක කරන ලද දැව හා දැව නිෂ්පාදන ගබඩා කිරීම හා විකිණීම.
- අධිකරණ විසින් කරන ලද නියමවලට යටත්ව එම අධිකරණය විසින් ලබාදෙන ලද රාජසන්තක නොකරන ලද දැව සහ දැව නිෂ්පාදන ගබඩා කිරීම හා විකිණීම.

# අපගේ ව්‍යාපාරික වටිනාකම්

ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.

පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමනාකරණයට සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටුකිරීමට අපි කැපවෙමු.

ගනුදෙනුකරුවන් සමග ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගනිමින්, ඔවුනට සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.

කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියලු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

සියලුම මෙහෙයුම් කටයුතුවලදී සහ සේවා සැපයීමේදී ප්‍රමිතිය හා පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබාගන්නා බවට සහතික වන්නෙමු.

අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.



# අධ්‍යක්ෂ මණ්ඩලය - 2024



**බී.එස්. ගුණරත්න මහතා**
**සභාපති** (2024.01.01 - 2024.09.30)
රාජ්‍ය දැව සංස්ථාව

---

**ඊ.ජ්.පී.එන්. එදිරිසිංහ මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.12.31)
වන සංරක්ෂක දෙපාර්තමේන්තුව

---

**එච්.පී. කේ. පෙරේරා මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.12.31)
මුදල් අමාත්‍යාංශය

---

**සී. වික්‍රමරත්න මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.09.30)

---

**චන්දන පෙරේරා මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.09.30)

---

**කේ.ඒ.ඩී.එස්.සී.කේ. කතුරුසිංහ මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.09.30)

---

**ඊ.ආර්. කුලතුංග මහතා**
**අධ්‍යක්ෂ** (2024.01.01 - 2024.09.30)

---

**ටී.ඩී. සමරවික්‍රම මිය**
**ලේකම්** (2024.01.01 - 2024.04.30)

---

**එච්.එම්.එස්. මාධව මහතා**
**ලේකම්** (2024.06.11 - 2024.09.30)

---

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල - 2024

- **ආචාර්ය නිමල් රුවන්පතිරණ**
  සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

- **ජී.ඩී.එස්. කුමාරසිංහ මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

- **එම්.ජී.සී.එන්. සමරසිංහ මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

- **පී.කේ. අජිත් චන්දන මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

- **ඩබ්.බී. සමන්ත මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

- **ජී.ජී. තිසර ගමගේ මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු හා නිෂ්පාදන)

- **එච්.එම්.එස්. මාධව මහතා**
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)

- **ආචාර්ය සී.කේ. මුතුමාල මහතා**
  සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ, සංවර්ධන හා පුහුණු)

- **එච්.බී. රජවත්ත මහතා**
  සහකාර සාමාන්‍යාධිකාරී (කලාප I)

- **ඩී.එච්. රාජපක්ෂ මහතා**
  සහකාර සාමාන්‍යාධිකාරී (කලාප II) වැ.බ.

# මෙහෙයුම් අංශයේ කාර්යභාරය

රජය සතු ප්‍රාග්ධන භාණ්ඩයක් වන වනවගා කළමනාකරණය කිරීම හා අඛණ්ඩව දැව නිෂ්පාදනය සඳහා වන වගා පවත්වාගෙන යාම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවීමට ප්‍රථම දැව නිෂ්පාදන ක්‍රියාවලිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වූ අතර 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතට අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලෙස රුපියල් විසිපන්ලක්ෂයක් යොදවා 1968 අප්‍රේල් මස 04 වන දින රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවන ලදී. ආරම්භක ප්‍රාග්ධනය ලෙස රාජ්‍ය මුදල් යොදවා තිබීම රාජ්‍ය හිමිකාරිත්වයට හේතු විය. එතෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද දැව අස්වනු නෙලීම හා අලෙවියට අදාළ සියළු කාර්යයන් රාජ්‍ය දැව සංස්ථාවට පවරා ඇත.

ඒ අනුව රාජ්‍ය දැව සංස්ථාව ප්‍රධාන වශයෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන වගාවල දැව අස්වනු නෙලීම ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය, ගෘහභාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය දැවමය අමුද්‍රව්‍ය සැපයීම හා අනෙකුත් රජයේ හා රාජ්‍ය නොවන අංශවල සංවර්ධන ව්‍යාපෘති සඳහා කඳන් ,ඉරුදැව, සිල්පර, විදුලිකණු, අලිවැටකණු, දර හා අනෙකුත් දැවමය නිෂ්පාදන සැපයීම පුරා වසර 56 ක් තිස්සේ අඛණ්ඩව සිදු කරමින් පවතී. රාජ්‍ය දැව සංස්ථාවේ, දැව අස්වනු නෙලීම මෙහෙවරේ ඉතාම භාරදූර වගකීමක් ඉටු කරනු ලබන්නේ මෙහෙයුම් අංශය මගිනි.

දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශිය කාර්යාල 10 ක් පිහිටුවා මෙහෙයුම් අංශයේ කාර්යභාරය විමධ්‍යගත කර ඇත.

**දැව අස්වනු ලැබීම**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2024 වර්ෂයේ එක් එක් දිස්ත්‍රික්ක වල නිදහස් කරන ලද පූර්ණ හෙළීම්, තුනීකිරීම් හා වරණීය හෙළීම් වනවගා වලින් ප්‍රධාන වශයෙන් පහත පරිදි දැව ලැබීම සිදු විය. වාර්ෂිකව රට තුල අලෙවි වන තේක්ක දැව ප්‍රමාණය ගණනය කර ඒ අනුව 2024 වර්ෂයේ ද එම දැව පරිමාව ලබා ගත හැකි වන පරිදි වගා ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කලද දැනට හෙළීම් කරලීම සඳහා නියමිත වයස් සීමාවල පවතින පරිනත තේක්ක වන වගා ප්‍රමාණය අවම වීම හා පරිනත වයස් සීමාවල ඇති තේක්ක වන වගා බොහෝමයක් අලි ක්‍රියාකාරකම් නිසා හානි පැමිණිවීම සිදුවීමෙන් ලැබුණු තේක්ක වන වගා ප්‍රමාණය සීමා සහිත වීමෙන්, ගුණාත්මක තේක්ක දැව ප්‍රමාණය වෙළඳපලෙහි ඉල්ලුමට අනුව සැපයීමට නොහැකි විය. වන වගා වලින් ලැබුණු දැව ප්‍රමාණයට අමතරව සංවර්ධන යෝජනා ක්‍රම වලින්ද 2024 වර්ෂයේ දැව ලැබීම් සිදු විය. මෙයට අමතරව රජය සතු භූමි වලින් ඉවත් කල යුතු අනතුරුදායක හා පරිත්‍යාග දැව ලෙස විශාල දැව අස්වනු ප්‍රමාණයක් දිවයිනේ ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් ලැබිණි. එසේම අනවසර දැව හෙළීම් හා අධිකරණමය ක්‍රියා මගින් රාජසන්තක කරන ලද දැව සුළු ප්‍රමාණයක්ද 2024 වර්ෂයේ අප වෙත ලැබිණි.

**2024 වර්ෂය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැව අස්වනු හෙළීම සඳහා නිදහස් කරන ලද වන වගා ප්‍රමාණය.**

| දැව විශේෂය | පූර්ණ හෙලීම් ha ප්‍රමාණය |
|---|---|
| තේක්ක | 212 |
| යුකැලිප්ටස් | 43.4 |
| පයිනස් | 293 |
| කායා | |
| ඇකේෂියා | |

**2024 වර්ෂයේ නිෂ්පාදන දැව පරිමාව**

| දැව විශේෂය | පරිමාව (ඝ.මී.) |
|---|---|
| තේක්ක | 18448 |
| යුකැලිප්ටස් | 7651 |
| පයිනස් | 32291 |
| කායා | 1735 |
| මහෝගනී | 2177 |

**සංවර්ධන යෝජනා ක්‍රම හා අනතුරුදායක පරිත්‍යාග වලින් ලැබුණු දැව පරිමාව.**

| දැව ලැබීම් ප්‍රභවය | පරිමාව (ඝ.මී.) |
|---|---|
| අනතුරුදායක පරිත්‍යාග දැව | 31110 |
| වන අපරාධ දැව | 1841 |

රාජ්‍ය දැව සංස්ථාව මගින් වෙළඳපල වෙත සපයනු ලබන දැව අස්වනු ප්‍රමාණය මත දැව වෙළඳපලෙහි මිල තීරණය වෙයි. පරිසර හිතකාමී ගුණාත්මක දැව නිෂ්පාදනයක් සිදු කරන එකම රාජ්‍ය ආයතනය වන්නේ රාජ්‍ය දැව සංස්ථාව බැවින් ආයතනයේ පැවැත්ම හා ලාභදායි තත්වයට මෙන්ම දැව පාරිභෝගික ජනතාවට සහනදායී මිලට දැව හා දැවමය නිෂ්පාදන ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට රාජ්‍ය මැදිහත්වීම මෙයට වඩා අත්‍යවශ්‍ය බව අප තරයේ විශ්වාස කරනු ලබයි.

**තාක්ෂණික දැව අස්වනු නෙලීම**


වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හෙලීම් සඳහා නිදහස් කරනු ලබන වනවගා මෙන්ම සංවර්ධන යෝජනා ක්‍රම, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉවත් කරලීමට දෙනු ලබන වනවගා හා අනෙකුත් හෙලීම් වන වගා වල දැව ඉවත් කිරීමට ප්‍රථම එම දැව හෙලනු ලබන භූමි වර්ගීකරණය කිරීම, දැව පරිමාව ගණනය කිරීම, තාවකාලික දැව ඉවත් කරලීමට මාර්ග ඉදිකිරීම හා දැව අස්වනු නෙලීමට යන නිෂ්පාදන වියදම ගණනය කිරීම යන කාර්යයන් සඳහා විද්වත් තාක්ෂණික කමිටුවක් මගින් අදාළ පිරිවිතර යටතේ පරීක්ෂා කර බලා වාර්තා සකස් කිරීම සිදු කරනු ලබයි. වන වගාවල ඇති දැව අස්වැන්න අනුව ස්කන්ධභාග ගණනය කර එමගින් වාර්ෂිකව රජයට ලැබිය යුතු මූල්‍ය දායකත්වය ලබාදීමට මෙහෙයුම් අංශය සෑම විටම කටයුතු කරන ලදී.

**2024 රජයට ලබා දුන් ස්කන්ධභාග මුදල (බදු රහිතව)**

| දැව විශේෂය | මුදල |
|---|---|
| තේක්ක | 332,009,499 |
| යුකැලිප්ටස් | 30,390,695 |
| පයිනස් | 176,924,499 |
| පූර්ණ හෙලීම් නොවන වනවගා වලින් | 24,908,862 |
| **එකතුව** | **564,233,557** |

**විදුලිකණු හා සිල්පර නිෂ්පාදනය**

අපගේ ප්‍රධාන නිෂ්පාදනයක් වන සිල්පර හා විදුලි කණු නිෂ්පාදනය ක්‍රමානුකූලව පසුගිය දශකය තුල ඉල්ලුමෙහි අඩුවීමක් දක්නට ලැබිණි. මෙහි ප්‍රධාන හේතුව වී ඇත්තේ විදුලි කණු මිලදී ගන්නා එකම ගැණුම්කරු වන ලංකා විදුලි බල මණ්ඩලය ලී විදුලි කණු වෙනුවට කොන්ක්‍රීට් වලින් නිර්මාණය කරන ලද අඩු බර කණු මිලදී ගැනීමට යොමු වීමත් , සිල්පර මිලදී ගනු ලබන දුම්රිය දෙපාර්තමේන්තුව ලී සිල්පර වෙනුවට කොන්ක්‍රීට් සිල්පර වලට යොමු වීමත් වෙයි. ඉල්ලුමෙහි අඩුවීම පහත ආකාරයට පෙන්නුම් කළ හැක.




**සිල්පර හා විදුලි කණු නිෂ්පාදන ප්‍රමාණය**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| සිල්පර | 38380 | 29049 | 34113 | 21887 | 27840 |
| විදුලි කණු | - | 2624 | 1837 | 5916 | 1637 |

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්ෂිකව ලැබෙන වාණිජ තුනී කිරීම් වනවගා වලින් විදුලි කණු නිෂ්පාදනය කරන අතර, විදුලි කණු නොගැනීම නිසා කණු සඳහා විකල්ප අලෙවි ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ලී කණු සඳහා සංචාරක ව්‍යාපාරය තුල වෙරළ ආසන්න තාවකාලික ඉදිකිරීම් හා සංචාරක නිවාඩු නිකේතන සඳහා ඉල්ලුමක් ලැබී ඇති අතර ඒ සඳහා බොරොන් පරිරක්ෂණය කර අගය එකතු කර අලෙවි කිරීමට උපාය මාර්ග ගෙන ඇත. තුනීකිරීම් වලින් ලැබෙන මයික්‍රෝ විශේෂ දැව වලින් අලි කණු නිෂ්පාදනය කරලීම සිදු කරයි. නමුත් වාණිජ තුනී කිරීම් වලින් ලැබෙන දැව අස්වැන්න අලෙවි කරලීම සඳහා ප්‍රමාණවත් විකල්පයක් නොවේ.


සිල්පර පරිවර්ථනය කරන යුකැලිප්ටස් දැව විශේෂ වලින් ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ඉරුදැව පරිවර්තනය කර ලබාදීමට මූලික අරමුණු කර 2024 වර්ෂයේ අමතර ඉරුම්හල් දෙකක් මිලදී ගෙන කැප්පෙටිපොල ඒකකයේ ස්ථාපිත කරන ලදී.

**ගංගා ඇළදොළ වල වැටී ඇති දැව ඉවත් කිරිම.**
සංවර්ධන යෝජනා ක්‍රම වලට අමතරව ගංගා හා ඇළදොළ හරහා වැටී ඇති බොහෝමයක් කුඹුක් හා මී දැව විශේෂ, මෙහෙයුම් අංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ප්‍රාදේශිකවල නිළධාරීන් යොදවා ඉවත් කරලීම සිදු කරන ලදී. එමගින් 2024 වර්ෂයේ පහත පරිදි කුඹුක් දැව අස්වැන්නක් මුළු දැව පරිමාවට එකතු විය.

| ප්‍රාදේශිකය | කුඹුක් දැව පරිමාව |
|---|---|
| බණ්ඩාරවෙල | 1022 |
| කුරුණෑගල | 597 |
| මාතර | 343 |
| අනුරාධපුරය | 397 |
| අම්පාර | 51 |
| කොළඹ | 43 |
| යාපනය | 14 |
| නුවර | 207 |
| නුවරඑළිය | 09 |
| රත්නපුර | 361 |

ගංගා ඇළදොළ වල වැටී ඇති කුඹුක් දැව නිසා වාරිමාර්ග පද්ධති අවහිරවීම මගින් කෘෂිකාර්මික කටයුතු වලට බාධක පැමිණිවීම හා විශාල ලෙස ගංගා ඉවුරු සෝදා යාම නිසා විශාල පාරිසරික ගැටළුවලට මුහුණදීමට සිදුවීමෙන් පසු අප ප්‍රාදේශිකවල නිලධාරීන් හා අදාළ ආයතන නිලධාරීන් සමග සාකච්ඡා කරලීමේ ප්‍රතිඵලයක් ලෙස එම දැව ඉවත් කල අතර, එමගින් ජාතික ආර්ථිකය හා පරිසරය ඔප්නංවාලීමට සෘජු දායකත්වයක් දක්වන ලදී.

# අපගේ ආවරණ කලාප
# ස්ථාන සිතියම - රාජ්‍ය දැව සංස්ථාව



# ආයතනික පාලනය

රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලනයෙහි (Corporate governance) ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැපවී සිටින අතර, එහි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

පාර්ශවකරුවන් සඳහා වන වගකීම් වෙත අවධානය යොමුකර ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ භාවිතයන් සැළසුම් කර ඇති අතර, එමගින් සංස්ථා සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින් සහ එය ක්‍රියාත්මක වන සියලුම ප්‍රජාවන් ඇතුළු එහි සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනාග නී. මෙම ලිපිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ආයතනික පාලන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිළි කරනු ලබයි.

**අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි මෙහෙයුම්**

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංස්ථාව පාලනය කරනු ලබන අතර, සංස්ථාවේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සහ අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙකුගෙන් සැදුම්ලත් අතර, ඉන් අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නිල වශයෙන් පත්කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ස්වාධීනත්වය හා විශේෂඥ දැනුම නිල වශයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙකු මුදල් අමාත්‍යාංශයෙන් පත්කරනු ලබයි.

සෑම රැස්වීමකටම පෙර, තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට අදාල සියලුම කළමනාකරණ තොරතුරු සහ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සංස්ථාවේ කාර්යසාධනය, නව ආයෝජන, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ නිශ්චිත මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන වෙනත් ගැටළු පිළිබඳව මණ්ඩල පත්‍රිකා රැස්වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ භාහිර පාර්ශවකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්වීම, ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතුය. තවද, සංස්ථාවේ සමස්ථ වාණිජ, මෙහෙයුම් හා උපායමාර්ගික සංවර්ධනයේ සියළු අංශ සඳහා ඔහු වගකිව යුතු අතර, ඒ සඳහා අනෙකුත් අධ්‍යක්ෂකවරුන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහය ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී තම අංශයට අදාළ කරුණු සාකච්ඡා කරන විට ඉහළ කළමනාකාරීත්වයේ සාමාජිකයන් රැස්වීම අතරතුර අදාළ අවස්ථාවේ පෙනී සිටී.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්**

- සංස්ථාවේ ව්‍යාපාර සහ කටයුතු මෙහෙයවීම.
- සංස්ථාවේ මෙහෙයුම් සැළසුම් සඳහා පදනමක් ලෙස කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ව්‍යාපාරයේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක බව සහතික කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික වීම.
- වාර්ෂික ප්‍රාග්ධනය සහ මෙහෙයුම් අයවැය අනුමත කිරීම සහ අයවැයට එරෙහිව කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- සංස්ථාවේ අවසාන මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම.
- නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතික වීම.
- සියලුම ගිවිසුම්, අත්පත්කර ගැනීම් හෝ වත්කම් බැහැර කිරීම සහ ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීම.

භාණ්ඩාගාරයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරයා සංස්ථාව සමග සෘජු හෝ වක්‍ර ද්‍රව්‍යමය සබඳතාවක් නොමැතිව ස්වාධීන වන අතර, එම අධ්‍යක්ෂකවරයා සතු පුළුල් පරාසයක විශේෂඥ දැනුම සහ වාණිජ ආයතනික සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ සැළකිය යුතු අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන දැක්මක් සහ විනිශ්චයක් ගෙන එයි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු

සියලුම අනු කමිටු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම, මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අනු කමිටු සඳහා වගකීම් පවරා ඇත.

### විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එම අධ්‍යක්ෂකවරුන් H.P.K. පෙරේරා මහතා - කමිටු සභාපති, චමින්ද වික්‍රමරත්න මහතා - කමිටු සාමාජික සහ චන්දන පෙරේරා මහතා - කමිටු සාමාජික වේ. සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ ප්‍රධානීන් අවශ්‍ය අවස්ථාවේදී විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. පිටු අංක 31 හි විගණන කමිටු වාර්තාව, මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පැහැදිළි කරනු ලබයි.

### අභ්‍යන්තර පාලන - Internal Controls

සංස්ථාවෙහි වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ විශ්වාසදායක තොරතුරු ජනනය වන, නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මෙම පද්ධතියට මූල්‍ය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය ඇතුළු සියලුම පාලනයන් ඇතුළත් වන අතර, අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පිටු අංක 33 සිට 34 දක්වා අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත.

අවුරුදු 05 ක කාලසීමාවක් ආවරණය වන උපාය මාර්ගික සැළසුම්වලට අමතරව, සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම පුළුල් අයවැය ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. වාර්ෂික අයවැය, තීරණාත්මක සාර්ථක සාධක හඳුනාගැනීම මගින් සියලු අංශ විසින් සකස් කරන ලද ක්‍රියාකාරී අරමුණු, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, සෑම මසකම එහි ප්‍රගතිය පරීක්ෂා කරනු ලබයි.

සංස්ථාවෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා ඇගයීමට ලක්කරන අතර, එහි සොයාගැනීම් විගණන කමිටුව විසින් පළමුව සමාලෝචනය කරනු ලබන අතර, ඉන්පසුව සැළකිය යුතු ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය දැනට පවතින අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලද අතර, එහි සඵලතාවය පිළිබඳව තෘප්තිමත් වේ.

### පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය

අධ්‍යක්‍ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගැනීමේ ඇති වැදගත්කම හඳුනාගන්නා අතර, සමස්ථ සංස්ථාව තුළම මෙය ඇති කිරීම සහතික කරයි. සංස්ථාව තුළ අභ්‍යන්තර සන්නිවේදනය ප්‍රධාන වශයෙන් විද්‍යුත් තැපෑල, සංදේශ සහ චක්‍රලේඛ හරහා සිදුකෙරේ.

සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන් සංස්ථාවේ වටිනාකම් සහ එහි සමාජ වගකීම්වලට අනුකූල බව අධ්‍යක්‍ෂ මණ්ඩලය සහතික කරනු ලබන අතර, සංස්ථාව තම සේවකයින්ගේ සහ සංවිධානය තුළ සිටින අනෙකුත් අයගේ පරිසරය, සෞඛ්‍ය සහ ආරක්‍ෂණ ප්‍රමිතීන් ආරක්‍ෂා කිරීම ප්‍රවර්ධනය කරයි. අදාල ක්‍රියාමාර්ග ආයතනික සමාජ වගකීම් වාර්තාවේ 37 සිට 44 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

### අනුකූලතාවය - Compliance

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ශක්තිමත් අභ්‍යන්තර අනුකූලතා ක්‍රියාපටිපාටි කෙරෙහි සැළකිය යුතු අවධාරණයක් ලබාදෙනු

ඇති අතර, අනුකූලතාවය සහතික කිරීම සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත රෙගුලාසිවල මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කර ඇත.

**පැවැත්ම - Going Concern**

සංස්ථාවේ මූල්‍ය තත්වය සහ මුදල් ප්‍රවාහ තත්වය මනාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ‘Going Concern’ පදනම අඛණ්ඩව භාවිතා කර ඇත. සංස්ථාවේ ඉදිරි කාලය සඳහා එහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි විශ්වාසය වේ.



# විගණන කමිටු වාර්තාව

**කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර එය අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

විගණන කමිටුවෙහි මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය ප්‍රතිඵල අවදානම් හා අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වන ගැටළු විසඳීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට එලඹීම සඳහා නිර්දේශ සැපයීමයි. එම කාර්ය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල බව ආයතනයට අදාල නීති හා යෝග්‍ය බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරනු ලබන නීති වලට අනුකූලවීම සහතික කරයි.

**සංයුතිය.**

විගණන කමිටුව පහත සඳහන් පරිදි අධ්‍යක්ෂකවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ.

| සාමාජිකයින්ගේ නම | සහභාගීත්වය |
|---|---|
| සභාපති - එච්.පී.කේ. පෙරේරා මහතා | 3/3 |
| සාමාජික - චමින්ද වික්‍රමරත්න මහතා | 3/3 |
| සාමාජික - චන්දන පෙරේරා මහතා | 1/3 |

තවද වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, බාහිර විගණන (විගණකාධිපති) නිරීක්ෂණයක් ලෙස සහභාගී වේ.

(නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන) විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

**රැස්වීම්**

සමාලෝචිත වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් 03 ක් පහත සඳහන් දිනවලදී පැවැත්වීය.

| | |
|---|---|
| I වන කාර්තුව | 2024.05.07 |
| ii වන කාර්තුව | 2024.07.30 |
| iii වන කාර්තුව | 2024.08.29 |

මෙම අවස්ථාවට අරාධනය මත සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු හා නිෂ්පාදන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සහභාගී විය.

**සමාලෝචිත වර්ෂය තුල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල සාරාංශය.**

2024 වර්ෂය තුල විගණන කමිටුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදිය.

**මූල්‍ය වාර්තාකරණය**

අවදානම් සහ පාලන ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් හරහා මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය පිළිබඳ සහතිකයන් සැපයීම සඳහා විගණන කමිටුවෙහි මූලික කාර්යයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) සමඟ සාකච්ඡා කර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කෙරිණි.

**අභ්‍යන්තර විගණනය**

නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධානත්වය දරණ සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කමිටුව සඳහා සහාය දක්වයි. අංශයේ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා විගණන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය වාර්ෂික විගණන සැලැස්මට අනුව විගණන කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන විමසුම සහ එයට අදාල නිර්දේශ සහිත විගණන වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග නිරීක්ෂණය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන වාර්තා /පැවරුම් සිදුකර වාර්තා නිකුත් කරන ලද අතර, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සහිත ප්‍රධාන කරුණු ඉස්මතු කරන ලදී. මීට අමතරව අංශය විසින් බාහිර විගණන ගැටළු පිළිබඳ පසු විපරම් කිරීම නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග හා යාවත්කාලීන කිරීම පිළිබඳවත් බාහිර විගණන අංශය සමඟ මනා සම්බන්ධීකරණයක් සිදු කරනු ලබයි.

**අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය.**

සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණක සහ බාහිර විගණක (විගණකාධිපති) විසින් සපයන ලද වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

**බාහිර විගණනය**

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම බාහිර විගණකගේ මඟපෙන්වීම ඇතිව සකස් කරන ලදී. වර්ෂය තුල බාහිර විගණනය මගින් කරන ලද නිරීක්ෂණයන් නිරන්තරයෙන් සමාලෝචනය කර ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. මීට අමතරව විගණන කමිටුවෙහි රැස්වීම් වලදී තවදුරටත් අභ්‍යන්තර පාලන ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා බාහිර විගණකවරයා සමඟ පුළුල් සාකච්ඡාවක් පවත්වන ලදී.

**නිගමනය**

සංස්ථාවේ මූල්‍ය කටයුතු සහ සංස්ථාවේ ප්‍රතිපත්ති පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බවට සාධාරණ සහතිකයක් ලබා දීමට සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවන් ප්‍රමාණවත් බවට විගණන කමිටුව වශයෙන් සෑහීමකට පත්විය හැකිය.

විගණන කමිටුව වෙනුවෙන්,

**එච්.පී.කේ.පෙරේරා**
සභාපති - විගණන කමිටුව.

# අවදානම් කළමනාකරණය

### (i) රාජ්‍ය දැව සංස්ථාව 2024

2024 දී රාජ්‍ය දැව සංස්ථාව දැඩි අභියෝගාත්මක පරිසරයක් තුල අභ්‍යන්තර හා බාහිර සාධක රැසකින් ක්‍රියාත්මක කිරීමට සිදුවිය. මෙම සංකීර්ණතාවය තුල, රාජ්‍ය දැව සංස්ථාව විසින් ව්‍යුහගත සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ රාමුවක් අනුගමනය කළ අතර, ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයකදී අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ සම්පීඩනය කිරීම සිදු කරන ලදී.

### (ii) වෙළඳපොළ අවදානම

ප්‍රධාන වශයෙන් රාජ්‍ය දැව සංස්ථාවට වෙළඳපොළ දැව නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීම බලපාන ලදී. විශේෂයෙන්ම ආර්ථිකයේ පැවති සංකූලතා මත ඉදිකිරීම් කර්මාන්තයේ දැඩි මන්දගාමීත්වයක් දක්නට ලැබුණි. දැව ඇතුළු අමුද්‍රව්‍යවල මිල ඉහළ යාම සහ පුද්ගලික සැපයුම්කරුවන්ගෙන් පැවති දැඩි තරඟකාරීත්වය සහ ආනයනික ආදේශනයන් තුලින් ඇතිවන බලපෑම මගින් අලෙවි ආදායම කෙරෙහි සෘජුව බලපෑම් කරන ලදී. මෙම වෙළඳපොළ ක්‍රියාකාරකම් රාජ්‍ය දැව සංස්ථාවේ ආදායම් ජනනයට සෘජු අවදානමකි.

### (iii) මෙහෙයුම් අවදානම

රාජ්‍ය දැව සංස්ථාවේ කඳන් නිෂ්පාදනය හැර අනෙකුත් ක්ෂේත්‍රවල එනම් ගෘහභාණ්ඩ නිෂ්පාදනය සහ ඉරූ දැව නිෂ්පාදන වාර්ෂික නිෂ්පාදන ඉලක්ක ළඟාකර ගැනීමට හැකිවුයේ සමාන්‍යයෙන් 50% ප්‍රමාණයකි. මෙයට ප්‍රධාන හේතුව වශයෙන් පුහුණු කම්කරුවන්ගේ හිඟය සහ බාහිර සේවකයන් මත වැඩි නැඹුරුවක් දැක්වීම බලපා ඇත. එසේම යල්පැන ගිය යන්ත්‍රෝපකරණ සහ නවීන තාක්ෂණය අවම වශයෙන් යොදා ගැනීම නිසා නිෂ්පාදන කාර්ය සාධනය පහත වැටීමත්, මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන් හඳුනාගත හැක.

### (iv) නීතිමය අවදානම

රාජ්‍ය දැව සංස්ථාව විසින් නිරතුරුව නීතිමය අවශ්‍යතා, අනුකූලතා හා වගකීම් දැඩි ලෙස අනුගමනය කරමින් ක්‍රියාත්මක විය. විශේෂයෙන්ම වන කළමණාකරණයේදී සහ දැව ප්‍රවාහන සම්බන්ධයෙන්. එසේම, කොන්ත්‍රාත්කරුවන්ගේ ගිවිසුම් විරෝධතා හා ගනුදෙනුකරුවන් සමඟ ඇතිවූ ගිවිසුම් ගැටළු සම්බන්ධ නීතිමය අවදානම් වලටද සංස්ථාව මුහුණ දුනි.

### (v) නියාමන අවදානම

අන්තර්ජාතිකව පිළිගත් තිරසාරතා සහතිකයන් (FSC හා PEFC වැනි) විශේෂයෙන් අපනයන වෙළඳපොළ සඳහා, නියාමන සම්බන්ධ අභියෝග ඇති කළේය. තවද, නීතිමය ප්‍රතිපත්ති සීමා හේතුවෙන් මිල ගණන් තීරණය කිරීමේ ස්වාධීනත්වය අඩාල වී, වෙළඳපොළේ ඇති වෙනස්කම් වලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාවටද බලපාන ලදී.

### (vi) උපායමාර්ගික අවදානම

සම්ප්‍රදායික දැව විකිණීම් සීමාවෙන් තවදුරටත් විවිධාංගීකරණය සිදු නොකිරීම මත රාජ්‍ය දැව සංස්ථාව සඳහා උපායමාර්ගික දුර්වලතා ඇති කළේය. දුර්වල අලෙවි උපායන් සහ අභ්‍යන්තර ක්‍රමවේද හේතුවෙන් නවෝත්පාදනයන් සහ නවීකරණයන් අඩු වී ආයතනයේ නිෂ්පාදන හෝ අපනයන වෙළඳපොළ පුළුල් වීම කෙරෙහි බාධාවන් සිදු වී ඇත.

### (vii) මූල්‍ය අවදානම

මෙහෙයුම් වියදම් ඉහළ යාම, වෙළඳපොළ මිල උච්චාවචනයන් සහ ගනුදෙනුකරුවන් හෝ ආයතනවලින් ගෙවීම් ප්‍රමාද වීම මගින් මූල්‍ය ස්ථායීත්වය හා ආයතනයෙහි කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි බලපෑම් සිදුකරන ලදී.

**(viii) අවදානම අඩුකිරීමේ මූලාශ්‍ර - 2024**

මෙම අවදානම් ආරම්භයේ දී හඳුනාගැනීම මඟින්, රාජ්‍ය දැව සංස්ථාව තම උපායමාර්ගික සහ අයවැය සැලසුම් ක්‍රියාවලියට ස්ථාවරභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීමට උපකාරී විය.

**(ix) ආදායම හා වෙළඳපොළ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම**

- ගුණත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය තුලින් වෙළඳපොළේ තත්ත්වය ශක්තිමත් කිරීම.
- තරඟකාරීභාවය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදන කාර්යසාධනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වඩා හොඳින් තේරුම් ගැනීමට හා ප්‍රතිචාර දැක්වීමට වෙළඳපොළ පර්යේෂණ සිදු කිරීම.
- වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණයන් මගින් වෙළඳ නාමය ප්‍රවර්ධනය කිරීම.
- සේවා ගුණාත්මකභාවය හා ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සඳහා ප්‍රදර්ශනාගාරවල ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධතා කළමනාකරණ (CRM) පද්ධතිය හඳුන්වා දීම.
- ගෘහභාණ්ඩ නිෂ්පාදනයේදී ගනුදෙනුකරුවන්ගේ ප්‍රමුඛ අවශ්‍යතා සමඟ සම්බන්ධ කිරීම මගින් නිෂ්පාදන ප්‍රමාණය අඩුවුවත් වැඩි විකුණුම් ආදායමක් ළඟා කර ගැනීම.
- සිල්පර නිෂ්පාදනය සඳහා රජයේ වන වගා දැව උපරිම ලෙස භාවිතා කිරීමෙන් බාහිර පාර්ශවයෙන් මිලදී ගැනීම් ප්‍රමාණය අඩු කිරීම.
- තේක්ක දැව මිල සාමාන්‍ය වෙළඳපොළ මට්ටමින් පවත්වා ගැනීම තුලින් ස්ථාවර ඉල්ලුම නිරතුරුව පවත්වා ගැනීම.
- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් අනුව අදාළ නිෂ්පාදන සඳහා තිරසාර සහතික නිකුත් කිරීමට පියවර ගැනීම.

**(x) ණය හා ණය ගනුදෙනු කළමනාකරණය ශක්තිමත් කිරීම**

- සම්පූර්ණ ණය ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රධාන ගනුදෙනුකරුවන්ගෙන් බැංකු ඇපකර, තැන්පතු සහ ආරක්ෂණ තැන්පතු භාර ගැනීම.
- ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මක භාවය කඩිනම් ලෙස ඇගයීම ක්‍රියාත්මක කිරීම.
- ණයගැති ශේෂයන් නිරීක්ෂණය කරමින් කාලෝචිතව එම ණය අය කර ගැනීමට උපායමාර්ගික ක්‍රියාමාර්ග ගැනීම.

**(xi) පාරිසරික, දේශපාලන සහ නියාමන අවදානම් සම්පීඩනය**

- නියාමන සහ නීතිමය අවශ්‍යතා සම්පූර්ණයෙන් පිළිපැදීම තහවුරු කිරීම.
- මෙහෙයුම් ජාතික පාලන ප්‍රතිපත්ති සහ අන්තර්ජාතික බලාත්මක ප්‍රතිපත්ති සමඟ සමාන්තරව ක්‍රියාත්මක කිරීම.
- නියාමන අපේක්ෂාවන්ට අනුව තිරසාර සහ ප්‍රමිතිගත මාර්ගෝපදේශ සපුරාලීමට කාර්යක්ෂම පියවර ගැනීම.

**(xii) වියදම් පාලනය සහ ආයෝජන කළමනාකරණය**

වියදම් පාලනයකින් පවත්වා ගැනීම සඳහා, රාජ්‍ය දැව සංස්ථාව විසින් නව සේවකයන් බඳවා ගැනීම තාවකාලිකව නතර කරමින්, ඉදිකිරීම්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් සඳහා ආයෝජනයන්ට වසර තුළ ප්‍රතිපාදන වෙන් කළද සීමා කරන ලදී. මෙම උපායමාර්ගික පියවර, පවතින සම්පත් උපරිම ලෙස භාවිතා කරමින් අස්ථිර ආර්ථිකය තුළ මූල්‍ය සුරක්ෂිතතාවය සහිතව පවත්වා ගැනීමට කෙරුණු වැඩපිළිවෙළක් විය.

# මානව සම්පත

රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිවරයාගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට ක්ෂේත්‍රයේ රාජකාරී කරන නිලධාරීන් දක්වාත් රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් සේවය සපයන වෙනත් කාර්ය මණ්ඩලත් ප්‍රධාන හා උප කොන්ත්‍රාත් ලැබ කර්තව්‍යන් ඉටු කරන අනෙක් ප්‍රජාවත් ආයතනයේ මානව සම්පත ලෙස සැලකිය හැකිය.

**කාර්ය මණ්ඩලය**

මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද 2308 ක් වන ස්ථිර කාර්ය මණ්ඩලයකුත් 99 දෙනෙකුගෙන් යුත් අනියම් කාර්ය මණ්ඩලයකුත් අතරින් දැනට 1277 ස්ථිර කාර්ය මණ්ඩලයක් හා 85 ක අනියම් කාර්ය මණ්ඩලයක් සෘජු සේවයක් ආයතනයේ ඉලක්ක කරා ළඟාවීම සඳහා දායකත්වය ලබා දෙන අතර, එයට අමතර වශයෙන් එක් කොන්ත්‍රාත් නිලධාරියකු හා දෛනික කාර්ය මණ්ඩලයක් ආයතනය වෙත දායකත්වය ලබා දෙයි. සමස්ථයක් වශයෙන් එම කාර්ය මණ්ඩලය දිවයින පුරා සේවා ස්ථාන 15 ක ස්ථානගත කර ඇති අතර, එක් නිශ්චිත දිනක ලබා දෙන ලද සේවාව පිළිබඳ විමසීම් කලහොත් එය, දිවයිනේ ඕනෑම ස්ථානයක විය හැකි තරමට අපගේ කාර්යයන් නගර, ගම්, කඳු මුඳුන්, බෑවුම්, කැලෑ, රක්ෂිත, නිෂ්පාදනාගාර හා කාර්යාල දක්වා විහිදී ඇත.

පසුගිය වසර 05 පුරාවට පැවති සේවක බඳවා ගැනීම් සීමා තුල විශේෂ අනුමැතියකින් 29 ක ද ප්‍රමාණයක් පමණක් අපගේ බල මුළුවට එක් කර ගැනීමට හැකි වූ අතර, ඒ අනුව එම පසුගිය වසර 05 ක, කාලය පුරාවටම සිදුවූ විශ්‍රාම ගැනීම් හෝ වෙනත් කාරණා හේතුවෙන් ඉවත් වූ 531 ක, සේවක ප්‍රමාණය විසින් ඉටු කරන ලද කාර්යය භාරයෙන් 55% ක ප්‍රමාණයක් දැනට සිටින සේවක පිරිස විසින් ඉටු කිරීම ප්‍රශංසනීය වේ.

ඒ තුල කාර්ය මණ්ඩලයෙහි කැපවීම සහ වටිනාකම පිළිබිඹු වේ. නිශ්චිත තනතුරක් හෙබ වුවද සේවකයාගේ උනන්දුවත් කැමැත්තත් ඇතුව අදාල කාර්ය සාක්ෂාත් කර ගැනීම සඳහා බහුවිධ විෂයන්හි සේවය කිරීමට අපගේ බලමුළුව පසුබට නොවීම මෙහිලා පැසසුමට ලක්කල යුතුය.

දැව හඳුනා ගැනීම, ආරක්ෂිත ක්‍රමවේදයකට අනුව හෙළීම් කිරීම, කුට්ටි කිරීම, පැටවීම හා ප්‍රවාහනය, ඉරීම, ගබඩා කිරීම, පරිරක්ෂණය කිරීම, අලෙවි කිරීම, තෝරා ගැනීම, ගෘහ භාණ්ඩ නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, වැද්දුම් හා ඔප දැමීම, ගෘහ භාණ්ඩ අලෙවියට පෙර විපරම් කිරීම හා අලෙවියෙන් පසු විපරම, පිළිබඳව කාර්යයෙහි නියැලීම සහ දීර්ඝ කාලීනව ඒ සම්බන්ධව ලබන ලද පුහුණුවෙන් සහ ලබා ඇති ප්‍රවීණත්වය විශේෂ ප්‍රාගුණ්‍යයක් ලෙස හඳුනා ගනිමින් අඩු කාර්ය මණ්ඩලයකින් වැඩි කාර්යයක් ඉටු කර ගැනීම ඉදිරියේදී අප විසින් ඉලක්කයක් කොට හඳුනාගෙන ඇත. වාර්ෂික පිරිවැටුම 2024 වර්ෂයේ 3% ක් වන අතර එය 2023 වර්ෂයට සාපේක්ෂව අඩු වුවද එක් සේවකයෙකු උපයන ලද ආදායම 3% ක් (දක්වාද / තුලින්ද) වර්ධනය වීම එය සනාථ කරනු ලබයි.

සෘජු ඵලදායි දායකත්වයක් සැපයිය හැකි වෘත්තියක් සඳහා සංස්ථා කාර්යය මණ්ඩල යොදා ගැනීමටත් එසේ නොවේයැයි හඳුනාගත් සේවා කාණ්ඩයන්ගෙන් සිදුවන සේවාවන් ක්‍රමක්‍රමයෙන් බාහිර පාර්ශවයන්ගෙන් බැහැරට පැවරීම (Outsource) කිරීම මඟින් සිදුකර ගැනීමත් ආයතනයේ අභිවෘද්ධිය හා රජයේ ඉලක්ක සාක්ෂාත්කර ගැනීමට දායක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා ප්‍රතිපත්තියක් වශයෙන් හඳුනාගෙන ඇත. දැව සංස්ථාවේ ආරක්ෂක සේවය, බැහැරට පැවරීම 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

**සේවා වියුක්තිකයෙකු සේවය කිරීමට වඩාත් සුදුසු ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව හඳුනාගත යුත්තේ ඇයි?**

රාජ්‍ය දැව සංස්ථා කාර්ය මණ්ඩලයේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සහ මානසික තත්ත්වය ඉහළ තත්ත්වයක අඛණ්ඩව පවත්වා ගැනීම රාජ්‍ය දැව සංස්ථාවෙහි එක් අරමුණක් වන අතර, ඒ තුළ සේවක තෘප්තිය කාර්යක්ෂමතාවය සඳහා එය අනුගත කර ගැනීම ප්‍රතිපත්ති වශයෙන් ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව චක්‍රීය ණය ක්‍රමය සේවකයින්ගේ විවිධ අවශ්‍යතාවයන් උදෙසා පිහිටුවා ඇති චක්‍රීය අරමුදලකින් සහන ණය වර්ග 07 ක් මේ තුල ක්‍රියාත්මක වේ.

- **වෛද්‍ය රක්ෂණය:-** සේවකයා සහ ඔහුගේ යැපෙන්නන් ආවරණය වන පරිදි වෛද්‍ය රක්ෂණයක් ක්‍රියාත්මක වේ.

- **සේවක දුක්ගැනවිලි කළමනාකරණය:-** සෘජුවම තම අංශ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීමට ඇති ගැටළු වෙතොත් ලිඛිතව හෝ වාචිකව ඕනෑම දිනක ගැටළු ඉදිරිපත් කල හැකි අතර, එය ඉඳුරාම අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දී ඇත.

- **වෘත්තිය සමිති:-** ආයතනයේ මුළු සේවකයන්ගෙන් බොහෝ සේවකයින් පිරිසක් වෘත්තිය සමිති සාමාජිකත්වය දරණ අතර, එවන් වෘත්තීය සමිති 15 ක් සංස්ථාව තුල ක්‍රියාත්මක වීම මඟින් පාලනාධිකාරිය සමඟ අඛණ්ඩව සම්බන්ධතාවයක් පවත්වා ගැනිම තුල සෑම පුද්ගලයකුගේම ගැටළු ඉදිරිපත් කිරීම සඳහා මෙය විකල්ප මාර්ගයක් ද වේ.

- **වැඩ පරිසරය:-** සිත් ඇද ගන්නා සුළු සහ වෘත්තීය හිතෛෂී කාර්යාල උපකරණ කාර්යාල පරිශ්‍ර හා කාර්ය මණ්ඩලය.

- **ආරක්ෂිත ක්‍රියාමාර්ග:-** අධි අවධානම්, අවධානම් හා සාමාන්‍ය ලෙස කාර්ය මණ්ඩලය කාණ්ඩ 03 කට හඳුනා ගනිමින් ආරක්ෂිත උපකරණ හා මෙවලම් සේවකයන් වෙත වාර්ෂිකව ලබා දීමත් හදිසි අනතුරු වන්දි, වෛද්‍ය රක්ෂණාවරණයට අමතරවද ලබාදීම සිදු කෙරේ.

මෙයට අමතර වශයෙන් සේවයට පැමිණීම දිරි ගැන්වීමක් ලෙස මාසික පැමිණීමේ දීරි දීමනා සහ දෛනික හා සති අන්ත පදනම මත ප්‍රවාහන ගාස්තු සීමාන්විතව කොන්දේසි වලට යටත්ව ලබා දීම යන කරුණුද 2024 වර්ෂයේ අපගේ සාර්ථකත්වය සඳහා හේතු වී ඇත. ඒ අනුව සිය දැනුම, කුසලතාවය ලබා දීම සඳහා වඩාත් සුදුසු සේවා යෝජකයකු ලෙස රාජ්‍ය දැව සංස්ථාව හඳුනා ගැනීමට හැකි වනු ඇත.



# ආයතනික සමාජ වගකීම

වගකීමෙන් යුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සියලුම බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ගේ වර්තමාන හා අනාගත පැවැත්ම අපගේ පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයක් බව අපගේ විශ්වාසයයි. ඒ අනුව දැව ව්‍යාපාරය තවදුරටත් වගකීමෙන් හා තිරසාර බැවින් වැඩිදියුණු කරමින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ළඟා කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම අපගේ අරමුණ වේ.




**පැළ බෙදාදීම සහ රුක් රෝපණ වැඩසටහන් සඳහා දායකත්වය**

රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශික 12ක් තුල පවත්වාගෙන යන පැල තවාන් 20 ක් හරහා වටිනා දැවමය සහ අනෙකුත් විශේෂ පැළ නිෂ්පාදනය කරනු ලබන අතර පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලයේ පැළ බෙදා දෙනු ලැබේ. රුක් රෝපණ වැඩසටහන් තුලින් දැව විශේෂ ප්‍රචලිත කිරීම හරහා දේශීය දැව කර්මාන්තය තිරසාර කිරීමට සහ ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අපේක්ෂා කරයි. තවද, ශාක ප්‍රජාවන් ආශ්‍රිත කාබන් සංචිත වැඩිදියුණු කිරීම තුලින් දේශගුණික විපර්යාසවලට විසඳුම් සෙවීම, දිවයිනේ වන ආවරණය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම, මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණු වේ. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වල අපගේ වපසරිය වන තිරසාර දැව කර්මාන්තය මත පදනම් වූ දැව පරිභෝජනය වැඩි කිරීම, අධ්‍යාපනික වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම ආදිය කෙරෙහි රාජ්‍ය දැව සංස්ථාව අවධානය යොමු කර ඇති අතර පැළ නිෂ්පාදනය හා රුක් රෝපණ වැඩසටහන් සඳහා අනුග්‍රහ දැක්වීම තුළින් පරිසර සංරක්ෂණය සම්බන්ධ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රටට සහය ලබා දීමද සිදු කරනු ලැබේ.

2024 වර්ෂයේදී විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා පැළ 19,300 ක් බෙදා දී ඇති අතර 2024 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ තවාන් මගින් පැළ 21,000 ක් නිෂ්පාදනය කර ඇත. පැළ බෙදා හැරීමේ විශේෂ අවස්ථා කිහිපයක් පහත සඳහන් වේ.

- ජාතික තරුණ සේවා සභාව = 5200
- ජගත් පරිසර දිනය නිමිත්තෙන් දීප ව්‍යාප්ත රුක් රෝපණ වැඩසටහන = 3085
- මණුසත් දෙරණ = 2550

- පිහිටි බෝසත් මිනිස් සාමූහිකත්වය, වාද්දුව = 2000
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව බදුරලිය = 1000
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මීගහතැන්න = 600
- යාපනය මහ නගර සභාව = 600
- වනාන්තර සුරකින්නෝ සංවිධානය = 500
- සිංහ සමාජය = 400
- බ්‍රවුන්ස් ටාෆ් ට්‍රැක් ටෙක් කැම්ප් නොමිලේ සේවා කඳවුර = 400
- දැරණියගල ජාතික පාසල = 300
- මධ්‍යම පරිසර අධිකාරිය - බත්තරමුල්ල = 300
- අනෙකුත් ආයතන = 2365



(ලෝක පරිසර දිනය සැමරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් පැළ සිටුවීම)



ගොවීන් සඳහා නොමිලේ පැළ පරිත්‍යාග කිරීම (Browns TAFE Track Tech Camp)

**අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු**

විවිධ පුහුණු වැඩසටහන් හරහා සේවකයින්ගේ නිපුණත්වය වර්ධනය කිරීමට රාජ්‍ය දැව සංස්ථාව උපරිම උත්සාහය දරයි. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) යනු සංස්ථාවේ පුහුණු ආයතනය වන අතර එය විශාල වපසරියක පුහුණුවීම් සපයයි. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) යටතේ දැව තාක්ෂණ පුහුණු ආයතනය ලියාපදිංචි කර ඇත (ලියාපදිංචි අංක P01/0365).

| අනු අංකය | පවත්වන ලද / පෞද්ගලික සහ බාහිර පුහුණු වැඩසටහන් | පුහුණු වැඩසටහන් ගණන | ඉලක්කගත කාණ්ඩය | පුහුණු කරන ලද සේවකයින් ගණන |
|---|---|---|---|---|
| 01 | පශ්චාත්උපාධි / උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා / සහතික සේවකයන්ගේ පුද්ගලික ඉල්ලීම් මත බාහිර ආයතන මගින් සපයනු ලැබේ. | 27 | කළමනාකරණ සහකාර | 30 |
| 02 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව / දැව සංස්ථාව කලමනාකරණ සම්මන්ත්‍රණය | 01 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා දැව සංස්ථාව | 151 |
| 03 | IEP Sri Lanka සම්මන්ත්‍රණයකට සහභාගි වීම | 01 | සහකාර කළමනාකාර (පර්.සං) | 01 |
| 04 | අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැළසුම් | 01 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01 |
| 06 | කම්කරු නීතිය | 01 | විගණන පරීක්ෂණ සහ අභ්‍යන්තර විගණන<br>සහකාර කළමනාකාර | 45 |
| 07 | මැහෝගනී වනවගා කළමනාකරණ සැලැස්ම පිළිබඳ වැඩමුළුව | 01 | රාජ්‍ය දැව සංස්ථාව<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 10 |
| 08 | විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම හා නිවැරදි කිරීමේ ක්‍රියාවලිය | 01 | විගණන අංශය | 04 |
| 09 | අත්‍යවශ්‍ය කම්කරු නීතිය | 02 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන / මානව සම්පත්)<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)<br>සහකාර සාමාන්‍යාධිකාරී (පර්.පුහුණු)<br>කළමනාකරණ (නීති) | 05 |
| 10 | 5 S විගණන නිළධාරීන් පුහුණු කිරීම | 01 | කළමනාකරණ සහකාර | 03 |
| 11 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | කළමනාකරණ සහකාර<br>ගබඩා නිළධාරී<br>කළමනාකරණ සහකාර (පුහුණු) | 03 |
| 12 | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය | 01 | පාලන නිළධාරීන් සහ කළමනාකරණ සහකාර නිළධාරීන් | 50 |
| 13 | කියත් සම්බන්ධ පුහුණුව | 01 | කල්දමුල්ල විගණන අංශයේ නිළධාරීන් හා සේවකයින් | 15 |
| 14 | Woodmac ඉරුම්හල් සම්බන්ධ වැඩමුළුව | 01 | කැප්පෙටිපොළ ඒකකයේ සේවක මහත්වරුන් | 25 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | Digital Marketing සම්බන්ධ වැඩමුළුව | 01 | අලෙවි/ නිෂ්පාදන ඉංජිනේරු/ පර්යේෂණ අංශය | 35 |
| 16 | වනවගා සංගණනය හා GPS තාක්ෂණය | 02 | මුදල් අංශය<br>විගණන අංශය | 57 |
| 17 | ආයතනික කළමනාකරණය | 01 | කළමනාකරණ සහකාර | 02 |
| 18 | වියදම් හා ගෙවීම් පටිපාටිය | 01 | කළමනාකර (මුදල්) වැ/ආ<br>කළමනාකරණ සහකාර | 07 |
| 19 | රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිය | 02 | කළමනාකරණ සහකාර | 06 |
| 20 | පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම | 01 | කළමනාකරණ සහකාරවරුන් | 60 |
| 21 | වෘත්තීය බදුකරණය | 01 | සහකාර කළමනාකාර (මුදල්) | 01 |
| 24 | Advance Excel Work Shop | 01 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී<br>නියෝජ්‍ය කළමනාකාර<br>සහකාර කළමනාකාර | 05 |
| 25 | මුදල් රෙගුලාසි | 01 | JM, MM, MA මහත්ම මහත්මීන් | 60 |
| 26 | බදු නීතිය හා ආදායම් බදු වගකීම | 01 | නියෝජ්‍ය කළමනාකාර<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර (මුදල්) | 04 |
| | එකතුව | **52** | | **580** |

**2024 වර්ෂයේ මුළු පුහුණු වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව - 52**

**පුහුණු සේවක සංඛ්‍යාව - 580**

**මුළු පිරිවැය - රු. 2,714,800/=**



පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම පුහුණු වැඩමුළුව - 2024.11.22



කම්කරු නීතිය වැඩමුළුව - 2024.03.18

**බාහිර පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු**

රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය හා පෞද්ගලික අංශය සමග සම්බන්ධ වී දැව හා වන වගාව ආශ්‍රිත විෂයයන් පිළිබඳව දැනුවත් කිරීමේ කාර්යන් වල නියැලේ. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) බාහිර පුහුණු වැඩසටහන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2024 වර්ෂයේදී බාහිර පාර්ශ්වයන් සඳහා ලබා දී ඇති පුහුණු අවස්ථා පහත පරිදි වේ.

| ආයතනය | සිසුන් / සේවක ගණන |
|---|---|
| රුහුණු විශ්ව විද්‍යාලය | 44 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 80 |
| රණවිරු සම්පත් කේන්ද්‍රය - වත්තල | 53 |
| නැගෙනහිර විශ්ව විද්‍යාලය | 08 |
| නාවික හා සාගරික විද්‍යාපීඨය - ත්‍රිකුණාමලය | 29 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 185 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 65 |
| ශ්‍රී රාහුල ජාතික පාසල - අලව්ව | 33 |
| කො/ ධර්මරාජ මහා විද්‍යාලය (ජාතික පාසල) - පිළියන්දල | 30 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය | 03 |
| NSBM හරිත විශ්ව විද්‍යාලය | 25 |
| ජාතික ශිල්ප සභාව | 15 |
| **එකතුව** | **570** |

**බාහිර පුහුණු වැඩමුළු (TTTI)**



කො/ ධර්මරාජ මහා විද්‍යාලය (ජාතික පාසල)
විද්‍යාලය (ජාතික පාසල) - පිළියන්දල



NSBM හරිත සරසවිය

### NVQ ඇගයීම් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවෙහි දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සම්බන්ධ වී පැවත්වූ පුහුණු පාඨමාලා පහත පරිදි වේ.

- NVQ Level - 3 පාඨමාලා සඳහා පුහුණු වූ ගණන - 02
- NVQ Level - 4 පාඨමාලා සඳහා පුහුණු වූ ගණන - 15



වඩු කාර්මික NVQ Level - 4 පුහුණු පාඨමාලාව

### ජර්නල් පත්‍රිකා හා අන්තර්ජාතික සම්මන්ත්‍රණ පර්යේෂණ පත්‍රිකා

Muthumala, C.K., Amarasinghe, W.V.T.D., Mudalige, T. (2024). Anatomical Study for Wood Identification of Shorea Species in Sri Lanka, Proceedings of the 28th International Forestry and Environment Symposium 2024 of the Department of Forestry and Environmental Science, University of Sri Jayewardenepura, Sri Lanka. P. 146

C.K. Muthumala ( 2024). Assessment of the authenticity of timber species used in Sri Lanka: A case study, ISGSD 2024, 1 st International Symposium on Green Industry Initiative for Sustainable Industrial Development of the Industrial Development Board, Sri Lanka.

C. K. Muthumala (2024). Identification of mangrove wood using anatomical features in Sri Lanka: A study in Negambo Lagoon, Proceedings of the 2nd International Conference on Mangroves for Sustainability 2024, p. 14

Vindhya B., Anura A., Thusitha B., Muthumala, C. K. and Marikar, F. 2024. Assessment of the Boron Treatability Level of Lesser-Known Timber Species by the Impregnation Method, Lesnoy Zhurnal-Russian Forestry Journal, Northern (Arctic) Federal University, Лесной журнал 2024; (6) : 160-174; 10.37482/0536-1036-2024-6-160-174

Muthumala, C.K., Arunakumara, K.K.I.U. and Marikar. F.M.M.T. 2024. Identification of eucalyptus species by anatomical features, PRO LIGNO Journal, Vol. 20 N° 1 2024, Transilvania University Press Brasovpp. 36-41

G.C.E. Perera, C.K. Muthumala, MKTK Amarasinghe, and FMMT Marikar. 2024. Optimizing charcoal production: a comparison of three wood species and methods, Indonesian Journal of

Forestry Research Vol. 11 No. 2, October 2024, 139-153, SSN 2355-7079/E-ISSN 2406-8195, doi:10.59465/ijfr.2024.11.2.139-153

C. K. Muthumala and G. Y. Jayasinghe. 2024. Assessment of the Relationship Between Wood Density and Treatability of Khaya senegalensis Wood, R. Dissanayake et al. (eds.), Proceedings of the 1st International Conference on University-Industry Collaborations for Sustainable Development, Proceedings in Technology Transfer, https://doi.org/10.1007/978-981-97-5944-6_25

I. S. Hewage, M. S. Mendis, C. K. Muthumala, and R. U. Halwatura. 2024. The Effect of Wood Preservative Uptake for Organic Wood Preservatives by Dipping Diffusion Method, R.Dissanayake et al. (eds.), Proceedings of the 1st International Conference on University-Industry Collaborations for Sustainable Development, Proceedings in Technology Transfer, https://doi.org/10.1007/978-981-97-5944-6_31381

C. K. Muthumala, K. K. I. U. Arunakumara, Sudhira De Silva, P. L. A. G. Alwis, and S. M. J. P.Dayawansha (2023 Dec). Shrink Index-Based Timber Classification and Finger Joint Production ICSBE 2022, Lecture Notes in Civil Engineering 362, https://doi.org/10.1007/978-981-99-3471-3_23, pp. 319-331

**ප්‍රදර්ශන සඳහා දායකත්වය**

රාජ්‍ය දැව සංස්ථාව සක්‍රියව දැව සහ වාණිජ වන වගා තිරසාර භාවිතය ප්‍රචලිත කිරීමෙහි නිරත විය. එබැවින් රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශන සඳහා සහභාගී වීම මහජනතාවගේ දැනුම වැඩි දියුණු කිරීම අපේක්ෂා කරයි.

1. Expo - 2024 - බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව - 2024.06.19 සිට 2024.06.23 දක්වා
2. X Ban - 2024 - ගම්පහ බණ්ඩාරණායක විද්‍යාලය - 2024.07.24 සිට 2024.07.28 දක්වා




X Ban 2024 ප්‍රදර්ශනය

**බාහිර පාර්ශ්ව සඳහා තාක්ෂණික සහාය සැපයීම**

දැව සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය බාහිර ආයතන සඳහා තාක්ෂණික සහාය සපයයි. උදාහරණයක් ලෙස ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ලී භාණ්ඩ සඳහා පිරිවිතර සැකසීම, දැව භාවිතය පිළිබඳ උපදේශන යනාදිය වේ. මේ අනුව 2024 දී රාජ්‍ය දැව සංස්ථාව පහත ආයතන / වැඩසටහන් සඳහා සහාය විය.

1. පාසල් සිසුන් සඳහා දැව තාක්ෂණ වැඩමුළු පැවැත්වීම.
2. දැව ශිල්පීන්ගේ ගෘහ භාණ්ඩ සඳහා වැඩමුළු කිහිපයක් පැවැත්වීම - NAITA මාර්ගෝපදේශ පොත් සකස් කිරීම.
3. සම්මත කොහු කෙඳි කොසු සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට තාක්ෂණිකව සහාය දැක්වීම.
4. කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජාතික තිරසාර ජෛව ස්කන්ධ සංවර්ධන මූලාශ්‍ර පිළිබඳ වැඩසටහනට දායක වීම.
5. විශ්වවිද්‍යාල, වන විද්‍යාලය, කාර්මික විද්‍යාල සහ අනෙකුත් ආයතන සඳහා දැව තාක්ෂණ දේශන පැවැත්වීම.
6. පරිසර අමාත්‍යාංශය සංවිධානය කරන BTR වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
7. පරිසර අමාත්‍යාංශය මගින් සංවිධානය කරන UNFCCC - AFOLU Sector වැඩ සටහන සඳහා දායකත්වය ලබාදීම.
8. දැවමය ගෘහ භාණ්ඩ මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම.


**දැව හඳුනා ගැනීම සහ දැව වාර්තා නිකුත් කිරීම**


පටක විද්‍යාත්මක ලක්ෂණ තුළින් දැව හඳුනාගැනීම සඳහා පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය නවීන තාක්ෂණය භාවිත කරයි. මෙම ක්‍රියාවලිය යටතේ වාර්ෂිකව දැව හඳුනාගැනීමේ සහතික සහ අනෙකුත් වාර්තා 150-200ක් පමණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙත නිකුත් කෙරේ. දැව හඳුනා ගැනීමට අමතරව, (MOR),(MOE), සම්පීඩන පරීක්ෂණය (Compression test), ඝනත්ව පරීක්ෂණ සහ දැව පරිරක්ෂණ (Boron, CCB) වැනි ශක්ති ගුණාංග පරීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේදී පහත වාර්තා නිකුත් කර ඇත. පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව 152 ක් වූ අතර 2024 වසරේ නිකුත් කළ මුළු වාර්තා සංඛ්‍යාව 189 කි.

| දැව සහතික/ වාර්තා | නිකුත් කළ සහතික /වාර්තා |
|---|---|
| දැව හඳුනාගැනීම (නිකුත් කළ සහතික /වාර්තා) | 103 |
| තෙතමන පරීක්ෂාව | 25 |
| දැව ඝනත්ව පරීක්ෂාව | 03 |
| බෝරෝන් පරීක්ෂක පරීක්ෂාව | 16 |
| CCB පරීක්ෂක පරීක්ෂාව | 01 |
| දැව ශක්ති ගති ලක්ෂණ පරීක්ෂාව | 04 |
| වෙනත් දැව වර්තා (බාහිර පාර්ශවයන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ඉල්ලන ලද හෝ සාමාන්‍ය දැව තත්ත්ව වාර්තා) | 37 |
| මුළු සංඛ්‍යාව | **189** |


# ව්‍යාපාර සාරාංශය


## ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය





## ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය













# ව්‍යාපාර සාරාංශය


## නිෂ්පාදන ප්‍රවර්ධන ප්‍රවණතා විශ්ලේෂණ




## ප්‍රාග්ධන වියදම් - 2024

| විස්තරය (රු. මිලියන 2ට වඩා වැඩි) | රු. |
|---|---|
| පරිගණක සහ මුද්‍රණයන්ත්‍ර | 20.41 |
| ඉඩම් වැඩි දියුණු කිරීම | 5.69 |

## ආයෝජන

| | 31-12-2024 | 31-12-2023 |
|---|---|---|
| රජයේ භාණ්ඩාගාර බැඳුම්කර | 731,832,197 | 731,832,197 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 107,433,487 | 46,821,808 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 500,000 | 500,000 |
| මහජන බැංකුව | 2,355,535 | 2,188,897 |
| ලංකා බැංකුව | 2,842,070 | 1,871,445 |

# දශකයක තොරතුරු (නිරපේක්ෂ අගයන්)

| | | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු '000 | 4,132,052 | 4,522,238 | 4,630,718 | 4,457,024 | 4,608,413 | 4,372,033 | 5,996,789 | 5,465,421 | 5,147,304 | 4,765,343 |
| වාර්ෂික දළ ලාභය | රු '000 | 1,757,115 | 2,045,090 | 2,075,950 | 1,964,647 | 1,890,812 | 1,745,766 | 2,753,682 | 2,290,975 | 1,908,909 | 1,915,080 |
| පොලී සහ බදු වලට පෙර ශුද්ධ ලාභය | රු '000 | 768,699 | 659,732 | 966,804 | 672,433 | 512,947 | 569,521 | 1,496,156 | 1,015,986 | 1,273,734 | 824,720 |
| මුළු සේවක පිරිවැය | රු '000 | 1,449,749 | 1,789,572 | 1,572,775 | 1,553,598 | 1,584,418 | 1,640,020 | 1,580,855 | 1,776,363 | 1,774,507 | 1,731,262 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු '000 | 244,929 | 113,675 | 94,637 | 116,034 | 319,485 | 104,712 | 126,547 | 47,998 | 55,085 | 36,439 |
| වර්ෂාවසාන දිනට ජංගම නොවන වත්කම් | රු '000 | 1,743,580 | 1,732,640 | 1,894,597 | 1,978,855 | 2,581,165 | 1,966,637 | 2,158,971 | 2,391,511 | 2,050,668 | 2,004,632 |
| වර්ෂාවසාන දිනට ජංගම වත්කම් | රු '000 | 4,115,259 | 3,652,116 | 4,423,105 | 4,541,610 | 4,640,889 | 5,319,557 | 7,048,847 | 7,196,775 | 7,512,262 | 8,566,042 |
| වර්ෂාවසාන දිනට ජංගම වගකීම් | රු '000 | 1,480,966 | 897,087 | 1,234,716 | 1,047,668 | 967,481 | 985,365 | 1,791,411 | 1,423,068 | 972,510 | 1,586,727 |
| වර්ෂාවසාන දිනට ජංගම නොවන වගකීම් | රු '000 | 424,854 | 499,373 | 852,292 | 812,441 | 714,022 | 836,197 | 659,200 | 500,063 | 583,632 | 861,609 |
| වර්ෂාවසාන දිනට හිමිකම් | රු '000 | 3,953,019 | 3,988,297 | 4,230,694 | 4,660,357 | 5,540,551 | 5,464,633 | 6,757,207 | 7,665,155 | 8,006,788 | 8,122,338 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු '000 | 50,000 | 175,000 | 100,000 | 100,000 | 50,000 | 511,026 | 100,000 | 320,000 | 649,461 | 346,773 |
| වර්ෂාවසාන දිනට සේවක සංඛ්‍යාව | NOS. | 2,145 | 2,125 | 2,083 | 2,001 | 1,803 | 1,708 | 1,606 | 1,500 | 1,390 | 1,315 |
| ප්‍රධාන කාර්ය සාධන දර්ශක | | | | | | | | | | | |
| හිමිකමට : බදු පෙර ශුද්ධ ලාභය | % | 19.45 | 16.54 | 22.85 | 14.43 | 9.26 | 10.42 | 22.14 | 13.25 | 15.91 | 10.15 |
| මුළු වත්කම් වලට මූල්‍ය වියදම් සහ බදු පෙර ශුද්ධ ලාභය | % | 13.12 | 12.25 | 15.30 | 10.31 | 7.10 | 7.82 | 16.25 | 10.60 | 13.32 | 7.80 |
| ජංගම අනුපාතය | වාර | 2.78 | 4.07 | 3.58 | 4.33 | 4.80 | 5.40 | 3.93 | 5.06 | 7.72 | 5.40 |
| හිමිකම් : වත්කම් අනුපාතය | වාර | 0.67 | 0.74 | 0.67 | 0.71 | 0.77 | 0.75 | 0.73 | 0.80 | 0.84 | 0.77 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | % | 6.31 | 0.66 | 3.84 | 6.59 | 12.19 | 8.00 | 6.91 | 14.04 | 12.09 | 7.80 |
| මුළු ආදායම් වර්ධනය | % | 10.00 | 9.44 | 2.40 | (3.75) | 3.40 | (5.13) | 37.16 | (16.73) | (0.06) | (0.08) |

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. FWL/A/STC/01/2024/03/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 ජූලි 2-/ දින

29 JUL 2025

21 JUL 2025

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ජී.එච්.ඩී.ධර්මපාල

විගණකාධිපති (වැ.බ)

පිටපත්- 1. ලේකම් - මුදල් ,ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2. ලේකම් - පරිසර අමාත්‍යාංශය

22 JUL 2025


No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FWL/A/STC/01/2024/03/FA | මබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 ජූලි [illegible] දින

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය දැව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) දෛනික සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවානියුක්තකයින්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත කාලය තුළ නොගෙවීම නිසා 2010 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ගෙවිය යුතු අධිභාර රු.22,617,622 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා එම ප්‍රමාණයෙන් රඳවා ගත් ඉපයීම් අධිගණනය වී වගකීම් ඌණ ගණනය වී තිබුණි. තවද ඉහත අරමුදල සඳහා දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සඳහා ගෙවිය යුතු දායක මුදල ඇතුළත් කර නොතිබුණු අතර ඒ මත ගෙවිය යුතු අධිභාර මුදල ද ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සම්පත්පාය ගොඩනැගිල්ලෙහි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම ලෙස රු.10,200,000 ක් හා 2017 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාලව කුලී ආදායම ලෙස රු.57,000,000 ක්ද ගිණුම්ගත කර තිබුණ ද ලිඛිත ගිවිසුමක් නොවීය.

(ඇ) 2013 සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව වැඩියෙන් ගිණුම්ගතකර තිබූ කුලී ආදායම රු.1,426,235 ක් නිවැරදි කිරීමේදී රඳවාගත් ඉපයීම් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම් ගිණුමට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි.

(ඈ) සංස්ථාවේ කල්දෙමුල්ල ගබඩා පරිශ්‍රයෙහි ඉන්ධන ලීටර් 45,000 ක් ගබඩා කළ හැකි ලෙස රු.2,539,431 ක් වැයකොට 2022 ජූලි 26 දින වන විට ස්ථාපිත කර තිබුණු ඩීසල් ටැංකිය ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති පිරිවැය රු.1,613,245,995 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ප්‍රකාරව, භාණ්ඩාගාර බැඳුම්කර මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකමට හඳුනාගත යුතු වුවත්, සංස්ථාව විසින් 2021 සහ 2022 වර්ෂවලදී එකතුව රු.731,832,196 ක මිලකට මිලදී ගෙන තිබුණු භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගත් අවස්ථාවේ වූ ඉහත සඳහන් වටිනාකමට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 1.3 සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

3

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව විගණනයේ දී ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

4

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) සහ (ඉ) ඡේදයෙහි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති, විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය | අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබුණු සංස්ථාපිත නියෝගය අනුව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය 5 දෙනෙකු විය යුතු බව දක්වා ඇතත් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයින් 7 දෙනෙකු පත් කර තිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධිත) පනත සහ 1980 අංක 46 දරන සේවානියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත | 2006 සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවානියුක්තිකයින්ගේ භාර අරමුදලට අධිභාර වශයෙන් රු. 99,563,954 ක් සහ සේවකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් රු. 110,626.614 ක් සංස්ථාව විසින් ගෙවීම නිසා සංස්ථාවට රු.210,190,568 ක අලාභයක් සිදුවී තිබුණි. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත සංස්ථාවේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, 2023 වර්ෂය සඳහා වන සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2025 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අදාළ | 2024 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සංස්ථාවේ අරමුණු ඉටුකරගැනීම සඳහා සම්පූර්ණ කළයුතු උපායමාර්ග හා ක්‍රියාකාරකම් නිශ්චිතව දක්වමින් සහ එම ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම සම්පූර්ණ කිරීමට සහ අපේක්ෂිත මූල්‍ය ඇස්තමේන්තුව සඳහා |

| | |
|---|---|
| මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 02 වන ඡේදය | කාලරාමුවක් සහිතව අදාළ බලධාරීන්ට වගකීම් පැවරිය යුතු ආකාරය ඇතුළත්ව ආකෘතිය B ප්‍රකාරව සකස් කර නොතිබුණි. තවද සංස්ථාවේ අරමුණු හා කාර්යයන් 18 ක් දක්වා තිබුණද ක්‍රියාකාරී සැලැස්මෙහි කඳන්, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සහ එහි අලෙවිය සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2023 ජනවාරි 13 දිනැති අංක 2314/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් සංස්ථාවේ අරමුණු සහ කාර්යයන් අතරින් වන රෝපණය, දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි නිෂ්පාදන අපනයනය කිරීම, වේවැල් ආනයනය කිරීම, වන සංරක්ෂක ජනරාල්වරයාගේ අනුමතය මත, කළුවර දැව ප්‍රධාන ද්‍රව්‍ය ලෙස යොදා නොගත් සහ නිර්මාණ අලංකරණය සඳහා පමණක් කළුවර දැව යොදාගෙන ඇති ගෘහ භාණ්ඩ අපනයනය කිරීම, දැව භාණ්ඩ, දැවමය ගෘහ භාණ්ඩ හා දැවමය කලාත්මක නිෂ්පාදන පුද්ගලික අංශයෙන් මිල දී ගැනීම හා අලෙවි කිරීම සහ විදේශ ප්‍රදර්ශනාගාර හිමි ව්‍යාපාරික ආයතන සමග එළඹෙන ලද ගිවිසුම් යටතේ ගෘහ භාණ්ඩ අපනයනය කිරීම යන අරමුණු සහ කාර්යයන් සංස්ථාව විසින් ඉටු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3. වෙනත් කරුණු**

(අ) 2018 සහ 2019 වර්ෂවල දී උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිවල කුඹුක් කඳන් අලෙවියේ දී සිදු වී ඇති බවට අනාවරණය කරගෙන තිබුණු රු.2,952,271 ක අලාභයක් හා 2019 වර්ෂයේ දී බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ ඇප මුදල් නිදහස් කිරීමේ දී සිදු වූ අක්‍රමිකතා හේතුවෙන් ඇති වී තිබුණු රු.685,109 ක අලාභයක් සම්බන්ධයෙන් පවතින පරීක්ෂණ කටයුතු අවසන් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අලාභයන් අයකර ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාවට 2021 ඔක්තෝබර් 25 දින ලැබී තිබුණු හපුතලේ ජයමිණිපුර 01/003 පයිනස් වැවිල්ලෙහි සහ 2022 වර්ෂයේ ලබා දී තිබුණු පැල්ලපිටිය පයිනස් වන වගාවේ පූර්ණ හෙළීම් කටයුතු සඳහා ලංසු කැඳවීම් අනුමත කිරීමට අසාමාන්‍ය කාලයක් ගත කර තිබීම, යටිතල පහසුකම් සැපයීම ප්‍රමාද වීම සහ ස්වභාවික සාධක කෙරෙහි අවධානය යොමුකර සුදුසු කාලවකවානු අනුව හෙළීම් කටයුතු නොකිරීම නිසා 2025 ජූනි 30 දින වන විටත් දෙවන වැවිල්ලෙහි හෙළීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

7

(ඇ) 2022 වර්ෂයේ ඝන මීටර් 103,121 ක්වූ කඳන් නිෂ්පාදනය 2023 සහ 2024 වර්ෂවලදී පිළිවෙලින් ඝන මීටර් 93,103 ක් සහ ඝන මීටර් 87,176 ක් දක්වා සියයට 9.7 කින් හා 6.4 කින් ද පහල ගොස් තිබුණි. 2023 වර්ෂයේ ඝන මීටර් 4,528 ක්වූ ඉරු දැව නිෂ්පාදනය 2024 වර්ෂයේදී ඝන මීටර් 2,456 දක්වා සියයට 45 කින් ද, 2023 වර්ෂයේ ඝන මීටර් 2,623 ක්වූ ඉරු දැව අලෙවිය 2024 වර්ෂයේදී ඝන මීටර් 2,087 දක්වා සියයට 20 කින්ද, 2022 වර්ෂයේ දී රු.මිලියන 292 ක්වූ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය 2023 සහ 2024 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 194 ක් සහ රු.මිලියන 174 දක්වා සියයට 33.6 කින් සහ 11.5 කින් ද සංස්ථාවේ නිෂ්පාදන කාර්යය සාධනය පහත ගොස් තිබුණි.

(ඈ) 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු දැ හිඟුණුමේ පැවති රු.1,241,797,019 ක ශේෂයෙන් 2025 ජූලි 02 දිනට වසර 4 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.87,825,903 ක ශේෂයක් ද පැවතුණි.

(ඉ) ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, පරිගණක මිලදී ගැනීම හා උත්සව අත්තිකාරම් ලෙස සංස්ථා සේවකයන් වෙත ලබා දී තිබුණු විවිධ ණය හා අත්තිකාරම් මුදලින් 2024 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.32,619,836 ක ශේෂය තුළ ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට ලබා දුන් වසර දෙකක කාලය ඉක්මවූ රු. 1,360,042 ක්ද, පරිගණක මිලදී ගැනීම සඳහා ලබා දී තිබුණු වසර 4 ක කාලය ඉක්ම වූ රු. 156,020 ක්ද, උත්සව අත්තිකාරම් අයකර ගැනීමට ලබා දී තිබුණු මාස 10 ක කාලය ඉක්ම වූ රු. 139,260 ක් ද ලෙස එකතුව රු. 1,655,322 ක් ණය ගෙවීමට ලබා දෙන නියමිත කාලය වසර 1 සිට වසර 3 ක් ඉක්මවා තිබුණි.

(ඊ) සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් කටයුතුවලින් ජනිතවන කඳන්, ඉරු දැව හා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවායේ අලෙවිය සහ හුවමාරු කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂාකර පාලන කටයුතු සඳහා සහය ලබාගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගතහැකි දත්ත පද්ධතියක් සංස්ථාව සතුව නොතිබුණි.

(උ) 1985 ඔක්තෝබර් 31 දින ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ සාමාන්‍ය කොටස් 5,000 ක් රු.100 බැගින් රු.500,000 කට මිලදී ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයෝජනය සිදු කර අවුරුදු 39 ක් ගතවී තිබුණු නමුත් සංස්ථාවට කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

(ඌ) පල්ලේකැලේ නිෂ්පාදනාගාරයේ Dust collector යන්ත්‍රයක් හා වන අපරාධවලට සම්බන්ධ උසාවියෙන් නිදහස් කර තිබූ ජංගම ලී ඉරුම්හල් 03 කින් ඉරුම්හල් 2 ක්, වසර ගණනාවක සිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව දිරාපත්වීමට ඉඩහැර තිබුණි.

8

(ඒ) 2024 දෙසැම්බර් 31 දිනට බූස්ස නිෂ්පාදනාගාරයෙහි පැවති රු.20,412,522ක් වූ කෙරීගෙන යන වැඩ තුළ 2011 වර්ෂයේ සිට පැවත එන නොනිමි තොග පැවතුණි. මෙම නිෂ්පාදනාගාර සංකීර්ණයේ ගෘහභාණ්ඩ නිෂ්පාදනය කෙටි වැඩ ගිවිසුම් මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටුකරවා ගන්නා අතර එක් කාර්යක් නිමකිරීමට පෙර නැවත නැවත කාර්යන් ලබාදී ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් 26ක් වෙත කොටස් මුදල් වශයෙන් රු.11,435,700ක් ගෙවා තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

# වාර්ෂික ගිණුම්

## ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 3,981,154,984 | 4,092,128,811 |
| විකුණුම් පිරිවැය | 3 | (2,066,074,592) | (2,183,219,570) |
| **මෙහෙයුම් මත දළ ලාභය** | | **1,915,080,392** | **1,908,909,241** |
| **වෙනත් ආදායම්** | 6 | | |
| මෙහෙයුම් | 6.3 | 123,943,175 | 95,255,751 |
| මෙහෙයුම් නොවන | 6.1 | 9,280,921 | 14,568,317 |
| **මුළු ශුද්ධ ආදායම** | | **2,048,304,488** | **2,018,733,309** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (797,878,268) | (729,542,520) |
| පරිපාලන වියදම් | 5 | (1,076,156,770) | (959,724,662) |
| මූල්‍ය වියදම | | (515,453) | (1,082,440) |
| මූල්‍ය ආදායම | 6.2 | 650,966,254 | 945,351,151 |
| **භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය** | | **824,720,250** | **1,273,734,838** |
| | | | |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (29,091,766) | (117,943,033) |
| බදු පසු ලාභය | | 795,628,484 | 1,155,791805 |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (346,773,541) | (649,461,969) |
| | | | |
| **වර්ෂය සඳහා ලාභය** | | **448,854,943** | **506,329,836** |
| | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා | 17 | (333,304,478) | (164,697,250) |
| | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | **(333,304,478)** | **(164,697,250)** |
| | | | |
| **මුළු විස්තීරණ ආදායම්** | | **115,550,465** | **341,632,586** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | **2024** රු. | **2023** රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 8 | 995,176,082 | 1,155,995,376 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 10 | 7,735,659 | 7,735,659 |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 88,770,099 | 86,622,644 |
| ආයෝජන | 11.1 | 839,765,683 | 779,154,004 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 55,079,959 | |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | 15,139,314 | 18,194,374 |
| මුළු ජංගම වත්කම් | | **2,004,632,797** | **2,050,668,057** |
| | | | |
| ජංගම වත්කම් | | | |
| වෙළඳ තොග | 12 | 1,552,638,476 | 1,789,634,929 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 13 | 1,737,884,932 | 1,438,893,929 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 11.2 | 5,197,606,388 | 4,060,343,525 |
| මුදල් හා බැංකු ශේෂය | 14 | 77,913,163 | 223,390,474 |
| මුළු ජංගම වත්කම් | | **8,566,042,959** | **7,512,262,857** |
| | | | |
| මුළු වත්කම් | | **10,570,675,756** | **9,562,930,913** |
| ස්කන්ධය හා බැරකම් | | | |
| ස්කන්ධය හා සංචිත | | | |
| අනුමත ප්‍රාග්ධනය | | **75,000,000** | **75,000,000** |
| | | | |
| දායක ප්‍රාග්ධනය | 15 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 7,552,116,721 | 7,452,729,690 |
| | | **7,593,620,389** | **7,494,233,358** |
| | | | |
| සේවක ණය චක්‍රීය අරමුදල | 16 | 528,718,188 | 512,554,753 |
| මුළු ස්කන්ධය | | **8,122,338,577** | **8,006,788,112** |
| ජංගම නොවන බැරකම් | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 17 | 772,838,940 | 406,440,553 |
| සේවක ඇප තැන්පත් | | 88,770,849 | 86,623,394 |
| මෙහෙයුම් කල්බදු | 21 | | 3,655,778 |
| පොලී දරන වගකීම් | 7.2 | | 86,912,496 |
| මුළු ජංගම නොවන බැරකම් | | **861,609,789** | **583,632,222** |
| | | | |
| ජංගම බැරකම් | | | |
| ආදායම් බදු | 18 | (155,276,107) | 24,375,301 |
| පොලී දරන වගකීම් | 21 | 3,369,439 | 3,520,107 |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 19 | 1,738,634,058 | 944,615,173 |
| මුළු ජංගම බැරකම් | | **1,586,727,390** | **972,510,580** |
| මුළු බැරකම් | | **2,448,337,179** | **1,556,142,801** |
| | | | |
| මුළු ස්කන්ධය හා බැරකම් | | **10,570,675,756** | **9,562,930,913** |

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධානවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ අලාභ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, එදිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා සංස්ථාවේ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS SLFRS) සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් ප්‍රකාශයට පත් කරන ලද නිර්දේශිත පිළිවෙත් ප්‍රකාශයට අනුකූලව සකස් කර ඇත.

සාමාන්‍යාධිකාරී
රාජ්‍ය දැව සංස්ථාව

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 63 සිට 70 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 71 සිට 81 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශවල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

අධ්‍යක්ෂ

දිනය: 10.03.2025

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය රු. | සේවක ණය චක්‍රීය අරමුදල රු. | රඳවාගත් ලාභ රු. | ප්‍රත්‍යාගණනය සංචිතය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | **41,503,668** | **494,093,306** | **6,680,151,930** | **449,406,621** | **7,665,155,526** |
| වර්ෂය සඳහා ලාභය | | | 506,329,836 | | **506,329,836** |
| | | | | | |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | | 18,461,447 | (18,461,447) | | |
| | | | | | |
| වෙනත් විස්තීරණ ආදායම් | | | (164,697,250) | | **(164,697,250)** |
| | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | **41,503,668** | **512,554,753** | **7,003,323,069** | **449,406,621** | **8,006,788,113** |
| වර්ෂය සඳහා ලාභය | | | 448,854,943 | | **448,854,943** |
| | | | | | |
| වර්ෂය සඳහා සේවක ණයපොළිය ගැලපුම | | 16,163,435 | (16,163,435) | | |
| | | | | | |
| වෙනත් විස්තීරණ ආදායම් | | | (333,304,478) | | **(333,304,478)** |
| | | | | | |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | **41,503,668** | **528,718,188** | **7,102,710,100** | **449,406,621** | **8,122,338,578** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 3,853,703,451 | 4,064,517,097 |
| සැපයුම්කරුවන්ට හා සේවකයන්ට ගෙවූ මුදල් | (2,715,993,727) | (4,084,101,538) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල්** | **1,137,709,724** | **(19,584,441)** |
| ආදායම් බදු | (350,735,629) | (270,278,278) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (346,773,541) | (640,766,036) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **440,200,554** | **(930,628,755)** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර වත්කම් මිලදීගැනීම් | (37,257,688) | (54,647,451) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | | 3,591,344 |
| ආයෝජන | (1,197,874,542) | (159,562,728) |
| ආයෝජනවලින් ලද ආදායම | 660,668,893 | 1,294,205,736 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | (2,978,145) | |
| සේවක ණය නිකුත් කිරීම | (174,634,362) | (176,411,991) |
| සේවක ණය අයකරගැනීම | 170,719,878 | 168,455,259 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | **(581,355,965)** | **1,069,685,276** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| | | |
| පොළී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් මුදල් | (4,321,899) | (6,627,091.15) |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | **(4,321,899)** | **(6,627,091.15)** |
| | | |
| මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ අගය වැඩිවීම/අඩුවීම | **(145,477,311)** | **132,429,431** |
| | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන් 14) | 223,390,474 | 90,961,043 |
| | | |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන 14) | 77,913,163 | 223,390,474 |
| | | |
| මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ අගය වැඩිවීම/අඩුවීම | **(145,477,311)** | **132,429,431** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
# 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1.1 වාර්තාකරණ ආයතනය

1.1.1 සංස්ථාපනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදී.

1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය

2025 මාර්තු මස 10 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2024 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

1.1.3 සේවක සංඛ්‍යාව

2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 1,315 කි. (2023 - 1,390 කි.)

1.1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

1.2 ඉදිරිපත් කිරීමේ පදනම

1.2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන්වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟ ගිණුම් සඳහා සටහන් පිළියෙළ කර ඇත.

1.2.2 අගය කිරීමේ පදනම

ලැබිය යුතු සේවක ණය සහ වෙළෙඳ ණයගැතියන් සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වැටයීම් කර ඉදිරිපත් කර ඇත.

1.2.4 ඇස්තමේන්තු හා නිගමන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන

අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගළපනු ලැබේ.

**1.2.5 විදේශ විනිමය ගනුදෙනු**

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්ථනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

**1.2.6 බදුකරණය**

ගිණුම් ප්‍රකාශනවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන හා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධනවලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

**1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුළදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

**1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම**

**1.3.1.1 දේපල පිරියත හා උපකරණ**

**1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම**

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය ඍජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී.

**1.3.1.1.2 ප්‍රත්‍යාගණන ආකෘතිය**

ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය විධිමත් භාවයකින් යුතුව සිදුකරන අතර, එය වාර්තා කරන ගිණුම්කරණ වර්ෂය අවසානයේ සාධාරණ අගය මත පදනම්ව සිදුකරනු ලබන බැවින් ධාරණ අගය ප්‍රමාණාත්මක වශයෙන් සාධාරණ අගයට වඩා වෙනස් නොවේ.

මෝටර් රථ (යතුරුපැදි) ප්‍රත්‍යාගණනයේදී ඒවායෙහි ධාරණ අගය ප්‍රත්‍යාගනිත අගයන් සමඟ අඛණ්ඩව සකස් කෙරේ. එදිනට පවතින සමුච්චිත ක්ෂය අගය දළ ධාරණ අගය සහ හානිකරන අලාභ ගැලපීමෙන් පසු ධාරණ අගය යන දෙකෙහි වෙනසට සමාන වන පරිදි ගලපනු ලබයි.

ප්‍රත්‍යාගණයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල ධාරණ අගයෙහි වැඩිවීමක් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගන්නා අතර, එය හිමිකමෙහි ප්‍රත්‍යාගණන සංචිතයට එකතු කරනු ලබයි. පෙර සිදු කරන ලද ප්‍රත්‍යාගණනයකදී ලාභයෙහි හෝ අලාභයෙහි සටහන් කරන ලද එම වත්කමෙහි ප්‍රත්‍යාගණිත අගය අඩුවීමත්, ආපසු හැරවීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත මෙම වැඩිවීම ලාභ/අලාභයෙහි හඳුනාගනු ලබයි.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල ධාරන අගයෙහි අඩුවීමක් ප්‍රවර්තන වර්ෂයේ ලාභයෙහි/අලාභයෙහි හඳුනාගැනේ. මෙම අඩුවීම, එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින බැර ශේෂයෙහි පරාසය මත වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනාගනු ලබයි.

මෝටර් රථ වත්කම හඳුනාගැනීමේදී ඒ හා සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිතය ඍජුවම රඳවාගත් ආදායමට මාරු කෙරේ.

**1.3.1.1.3 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ**

වත්කම් විකිණීමෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේ දී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් / වියදම් යටතේ දක්වනු ලබයි.

**1.3.1.1.4 පසු පිරිවැය**

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

**1.3.1.1.5 ඉවත් කිරීම**

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙන එන ලද වටිනාකම ගිණුම්වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී ජනනය වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගළපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සළකනු නොලැබේ.

**1.3.1.1.6 ක්ෂයවීම**

දේපල, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරළ රේඛීය පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බඳු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |
| විදුලි උපකරණ | 10% |
| මෙවලම් හා උපකරණ | 20% |
| ඉඩම් සංවර්ධන | 10% |

1.3.1.2 නොනිමි වැඩ
ගිණුම් වර්ෂය තුළදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

1.3.1.3 අස්පෘශ්‍ය වත්කම්
අස්පෘශ්‍ය වත්කම්වලට පරිගණක මෘදුකාංග මිලදීගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුළත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්
"ජීව විද්‍යාත්මක වත්කම්" පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන් ය.

ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම්වලින් ඵලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට ජීව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිණතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගත වන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිනාමය සිදුවීමට අවුරුදු 10 ක කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ජීව විද්‍යාත්මක පරිනාමය සිදුවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත් එම කාලපරිච්ඡේදය තුළ සමාන වන බව උපකල්පනය කර ඇත.

### 1.3.1.5 මූල්‍ය උපකරණ

#### 1.3.1.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් පළමුව ණය මුදල, ලැබිය යුතු මුදල් හා තැන්පතු එළඹී දිනය මත පදනම් ව හඳුනාගැනීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හා අලාභ හරහා සාධාරණ අගය මත නම් කරන ලද වත්කම් ආශ්‍රාව) සංස්ථාව කොන්ත්‍රාත් විධිවිධානවලට අදාල පාර්ශවයක් බවට පත්වූ ගණුදෙනු සිදුවූ දිනය මත පදනම් ව හඳුනාගැනීම් සිදුකරනු ලබයි. වත්කම් කල්පිරීමේදී මූල්‍ය ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත හිමිකම් මත සංස්ථාව වත්කම් නැවත හඳුනාගැනීම හෝ මූල්‍ය වත්කම් ගනුදෙනුවලදී වත්කමට අදාල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය සමඟ සැළකිය යුතු සියලුම අවදානම් මාරු කරනු ලබයි.

##### 1.3.1.5.1.1 ණයට දුන් සහ අයවිය යුතු වත්කම්

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළෙඳපොළෙන් උපුටාගත නොහැකි මූල්‍ය වත්කම් ණය හා ලැබීම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට එයට අදාල සෘජු වියදම් එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මත මූලික හඳුනාගැනීම සිදුකරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හානිකරණ අලාභ ඉවත් කිරීමෙන් පසුව ඵලදායී පොළී ක්‍රමය යොදාගනිමින් එම වත්කම් නැවත හඳුනාගැනීම සිදුකරනු ලබයි. ණය හා ලැබීම් වෙළෙඳ හා වෙළෙඳ නොවන ලැබීම්වලින් සමන්විත වන අතර, සේවක ණය ද ඇතුළත් වේ. මුදල් හා මුදල් සමාන වත්කම් මුදල් ශේෂයන්ගෙන් හා ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වන අතර, ඒක්ෂණ තැන්පතු ඇතුළත් කරනු ලබන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ අරමුණ සඳහාය.

### 1.3.1.6 ආයෝජන

#### 1.3.1.6.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.2 දිගුකාලීන ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

#### 1.3.1.6.4 අපහායනය

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක් වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දූරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

### 1.3.1.7 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒම සඳහා දරන ලද සියලු වියදම් ඇතුළත්වය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී

පිරිවැයට සියලු ඍජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. යල්පැනගිය, සෙමින් චලනය වන හා දෝෂ සහිත තොග වෙනුවෙන් රු. 30,009,545/- ක තොග නශ්‍යවීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇත (2024).

### 1.3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීමය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම් ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

#### 1.3.2.1 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු වගකීම්

වෙළෙඳ හා අනෙකුත් කටයුතු සඳහා ගෙවීම් අදාල පිරිවැය අනුව සඳහන් කර ඇත.

#### 1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2024 දෙසැම්බර් 31 දිනට අවසන් කර ඇති සේවා කාලය හා අවසන් වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

#### 1.3.2.3 අසම්භාව්‍ය වත්කම් හා වගකීම් සඳහා වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ විශ්වාසනීයව මැනිය හැකි නීතිමය හෝ සාධාරණීකරණය කළ හැකි වගකීමක් පවතී නම් හා එම වගකීම ජනිතවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායෑමයක් නියත වශයෙන්ම සිදුවේ නම් පමණක් සංස්ථාව මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරව් කර ඇත.

බගවන්තලාව චැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බව දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරින් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වන සංරක්ෂණ ජෙනරාල් විසින් තීරණය කර ඇත. තවදුරටත් දැව සංස්ථාවට එරෙහිව පහත නඩු ගොනුකර ඇත.

නඩු අංකයඃ 1225/එම් (රු.1,000,000), නඩු අංකයඃ 4/එස් පී එල් (රු.500,000),
නඩු අංකයඃ 15404/එම් (රු.1,578,908), නඩු අංකයඃ 11651/එම් ආර් (රු.1,250,000),
නඩු අංකයඃ 5897/එම් (රු.600,000), නඩු අංකයඃ 3377/එම් (රු.1,000,000),
නඩු අංකයඃ 55857 (මහේස්ත්‍රාත් අධිකරණය තෙල්දෙණිය)

තවදුරටත් දැව සංස්ථාව විසින් පහත නඩුව ගොනුකර ඇත.
නඩු අංකයඃ 38804 (රු.2,500,000), නඩු අංකයඃ 7036 (කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය)
නඩු අංකයඃ 5271/එම් (රු.294,275), නඩු අංකයඃ ඒ/46/2021, නඩු අංකයඃ ඒ/31/2022,

නඩු අංකයඃ එල්ටී/44/798/2022, නඩු අංකයඃ එල්ටී/44/800/2022, නඩු අංකයඃ එම්/28211 (රු.300,000)
නඩු අංකයඃ එස්සී/එච්සී/එල්ඒ/35/2014, නඩු අංකයඃ එස්සී/සීඑච්/එල්ඒ/36/2014

ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් අංක.82355589, 88980062 සහ 90579752 ට එරෙහිව බැංකු ඇපකරයන් නිකුත් කර ඇත.

### 1.3.3 ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ එමගින් සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි හා එය විශ්වාසදායී ලෙස මැනිය හැකි විටදීය. දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළෙඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනු ලබන සහන ආදිය සැළකිල්ලට යොමු කිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමට ය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

#### 1.3.3.1 විකුණුම් ආදායම

භාණ්ඩ විකුණුම් ආදායම ලෙස පිළිගනු ලබන්නේ එම භාණ්ඩවල හිමිකාරීත්වය, අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ මිලදීගත් තැනැත්තා වෙත පැවරුණු අවස්ථාවේදීය. එනම්, භාණ්ඩ බෙදාහැරීමෙන් පසුව විකුණුම් ආදායමක් ලෙස සලකනු ලැබේ.

#### 1.3.3.2 පොළී ආදායම

උපචිත පදනම යටතේ පොළී ආදායම ගණනය කෙරේ.

### 1.3.4 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අළුත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

#### 1.3.4.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භිත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුළින් සෘජුව හඳුනාගන්නා අයිතමවලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භිත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනාගනී. ආදායම් බදු අනුපාතය 30% ක් වේ.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගත හැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

1.3.4.2 ස්කන්ධභාග ගෙවීම

2024 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

1.3.4.3 පිරිවැය වෙන්කිරීම

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොළේ පිරිවැය වෙන්කරනු ලබයි.

1.3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කළ දිනට පසුව පැණනැගි සියලු සැළකිය යුතු සිද්ධීන් සැළකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන් යටතේ නිසි ගැළපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

1.3.6 සේවක ණය චක්‍රීය අරමුදල

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොළී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොළී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

1.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඍජු ක්‍රමයට අනුව පිළියෙළ කර ඇත. මුදල් සහ මුදල්වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මනින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම්වලට ඇතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

1.3.8 පෙරගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

සේවක ණය 2024 වර්ෂයේ දී නාමික අගය ගිණුම්ගත කර ඇත.

1.4 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

1.4.1 කල්බදු

සංශෝධිත අතීතයානුයෝගී ප්‍රවේශය භාවිත කරමින් සංස්ථාව SLFRS 16 අනුගමනය කළේය. එහිදී 2024 ජනවාරි 01 දිනට මූලික භාවිතයේ සමුච්ත බලපෑම රඳවාගත් ඉපැයීම් තුළ හඳුනාගන්නා ලදී. ඒ අනුව 2023/24 සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර ඇත. එනම් එය පෙර වාර්තාවල පරිදි LKAS 17 යටතේ ඊට අදාලව ඉදිරිපත් කළ අර්ථකථන වේ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් පිළිබඳ පහත හෙළිදරව් කෙරේ. තවද, SLFRS 16 හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සංසන්දනාත්මක තොරතුරු සඳහා අදාල කර නැත.

## ගිණුම් සඳහා සටහන්

| 02. පිරිවැටුම | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| කඳන් - රජයේ ඉඩම්වලින් ලද | 2,297,905,796 | 2,329,150,420 |
| කඳන් - පුද්ගලික ඉඩම්වලින් ලද | 28,565,680 | 87,152,013 |
| ඉරුදූව | 189,405,433 | 233,895,652 |
| ඉරුදූව - ආනයනය කරන ලද | 13,238 | - |
| සිල්පර - පුද්ගලික ඉඩම්වලින් ලද | | 54,267,691 |
| සිල්පර - රජයේ ඉඩම්වලින් ලද | 654,379,966 | 571,834,053 |
| විදුලි සම්ප්‍රේෂණ කණු රජයේ ඉඩම්වලින් ලද | 64,706,888 | 60,586,298 |
| විදුලි සම්ප්‍රේෂණ කණු පුද්ගලික ඉඩම්වලින් ලද | 10,174,901 | 58,147,166 |
| අලිවැට කණු | 73,299,916 | 49,883,694 |
| වෙනත් | 22,735,140 | 22,629,656 |
| වන අපරාධ දූව | 19,104,507 | 37,941,325 |
| පරිත්‍යාග දූව | 352,308,649 | 316,643,803 |
| ගෘහභාණ්ඩ | 268,554,871 | 269,997,038 |
| **ශුද්ධ පිරිවැටුම** | **3,981,154,984** | **4,092,128,811** |

| 03. විකුණුම් පිරිවැය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| දැව ගබඩා හා මංසල ගබඩා | 931,108,326 | 811,245,772 |
| දැව පරිරක්ෂණාගාර | 140,679,630 | 513,782,060 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 254,675,504 | 262,313,363 |
| මංසල විකුණුම් | 739,611,133 | 595,878,375 |
| **එකතුව** | **2,066,074,592** | **2,183,219,570** |

| 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| දැව ගබඩා | 678,439,245 | 680,049,511 |
| දැව පරිරක්ෂණාගාර | 67,679,398 | 70,412 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 44,154,461 | 41,997,250 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 7,605,163 | 7,425,347 |
| **එකතුව** | **797,878,268** | **729,542,520** |

| 05. පරිපාලන වියදම් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| දැව පරීක්ෂණාගාර | 42,921,016 | 39,394,407 |
| ගෘහ භාණ්ඩ යන්ත්‍රාගාර | 99,422,526 | 72,637,515 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 924,843,296 | 840,546,391 |
| සංචාරක බංගලා | 8,969,932 | 7,146,349 |
| **එකතුව** | **1,076,156,770** | **959,724,662** |

| 06. වෙනත් ආදායම් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් නොවන ආදායම් - 6.1 | | |
| විදේශ විනිමය හුවමාරු (අලාභ) | 41,914 | 47,007 |
| ගොඩනැගිලි කුලිය | 9,239,007 | 14,507,700 |
| විශ්‍රාම පාරිතෝෂික අධි වෙන්කිරීම් | | 13,609.57 |
| **එකතුව** | **9,280,921** | **14,568,317** |
| | | |
| මූල්‍ය ආදායම - 6.2 | | |
| පොළී ආදායම් - ආයෝජන | 630,432,145 | 925,005,802 |
| සේවක ණය පොළිය | 20,534,109 | 20,345,350 |
| | **650,966,254** | **945,351,151** |
| මෙහෙයුම් ආදායම - 6.3 | | |
| විවිධ ආදායම් | 30,942,872 | 23,842,502 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | 3,165,764 | 107,596 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 76,914 | 248,373 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 13,969,630 | |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 72,002,440 | 67,690,968 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 1,815,381 | 1,910,526 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 1,970,173 | 1,455,785 |
| | **123,943,175** | **95,255,751** |
| **එකතුව** | **784,190,349** | **1,055,175,219** |

# වෙනත් ආදායම් විශ්ලේෂණය 2024

| | ඒකක | | | | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් මූලාශ්‍ර | අලෙවි ගබඩා | දැව පදම් කිරීමේ ඒකක | ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක | ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය | සංචාරක බංගලා | එකතුව |
| **මෙහෙයුම් නොවන ආදායම් 6.1** | | | | | | |
| විදේශ විනිමය හුවමාරු ලාභ / (අලාභ) | | | | 41,914 | | 41,914 |
| ගොඩනැගිලි කුළිය | | | | 9,239,007 | | 9,239,007 |
| | - | - | - | **9,280,921** | | **9,280,921** |
| | | | | | | |
| **මූල්‍ය ආදායම 6.2** | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | | | | 630,432,145 | | 630,432,145 |
| සේවක ණය පොළිය | | | | 20,534,109 | | 20,534,109 |
| | - | - | - | **650,966,254** | | **650,966,254** |
| | | | | | | |
| **මෙහෙයුම් ආදායම් 6.3** | | | | | | |
| විවිධ ආදායම් | 488,823 | 2,272 | 249,290 | 28,196,413 | 2,006,074 | 30,942,872 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | | | | 3,165,764 | | 3,165,764 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | | | | 76,914 | | 76,914 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 13,969,630 | | | | | 13,969,630 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 5,246,670 | 12,904,502 | 53,851,269 | - | | 72,002,440 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | | | | 1,815,381 | | 1,815,381 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | | | | 1,970,173 | | 1,970,173 |
| | **19,705,123** | **12,906,774** | **54,100,559** | **35,224,645** | **2,006,074** | **123,943,175** |
| එකතුව | **19,705,123** | **12,906,774** | **54,100,559** | **695,471,820** | **2,006,074** | **784,190,349** |

| 07. ආදායම් බදු | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| ප්‍රවර්තන බදු වියදම් | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු - 7.1 | 171,084,221 | 184,876,090 |
| පෙර වර්ෂය සඳහා අධි / ඌණ වෙන්කිරීම් | - | - |
| | **171,084,221** | **184,876,090** |
| **විලම්භිත බදු වියදම් - 7.2** | | |
| තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්තනය හා මූලාරම්භය | (141,992,456) | (66,933,057) |
| | **(141,992,456)** | **(66,933,057)** |
| **වර්ෂය සඳහා බදු අයකිරීම්** | **29,091,766** | **117,943,033** |

| 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| බදු පෙර ලාභය | 824,720,250 | 1,273,734,838 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 349,220,163 | 255,363,876 |
| සමාහාර ඉඩදෙන වියදම් | 896,557,285 | (1,223,222,170) |
| ව්‍යාපාරික ලාභය | 277,383,128 | 305,876,544 |
| ව්‍යාපාරික නොවන ආදායම් | 639,671,152 | 959,839,059 |
| තක්සේරු ආදායම් | 917,054,279 | 1,265,715,603 |
| අඩුකළ හැකි වියදම් | (346,773,541) | (649,461,969) |
| බදු අයකළ හැකි ආදායම් | 570,280,738 | 616,253,634 |
| ආදායම් බද්දෙන් | 171,084,221 | 184,876,090 |
| **එකතුව** | **171,084,221** | **184,876,090** |

| 7.2 විලම්භිත බදු | තාවකාලික වෙනස<br>රු. | බදු බලපෑම (වත්කම්) / වගකීම් රු. |
|---|---:|---:|
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 289,708,321 | 86,912,496 |
| වසර තුළ උත්පාදනය වූ මුදල | (473,308,186) | (141,992,456) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(183,599,864)** | **(55,079,959)** |
| | | |
| දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස | 589,239,076 | 176,771,722.79 |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ තාවකාලික වෙනස | 772,838,940 | 231,851,682.08 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(183,599,864)** | **(55,079,959)** |

## 08. දේපල පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය | | | | | ක්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2024.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | ගැලපීම් | 2024.12.31 දිනට ශේෂය | 2024.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම් | ගැලපීම් | වසර සඳහා අයකිරීම් | 2024.12.31 දිනට ශේෂය | 2024.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2023.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු) |
| ඉඩම් | 88,066,274 | | | | 88,066,274 | - | | | | | 88,066,274 | 88,066,274 |
| ඉඩම් සංවර්ධනය | 53,252,162 | 4,849,797 | | | 58,101,959 | 39,426,085 | | | 3,463,048 | 42,889,133 | 15,212,826 | 13,826,077 |
| ගොඩනැගිලි | 1,023,242,301 | 4,931,939 | | | 1,028,174,240 | 330,481,593 | | | 23,264,792 | 353,746,385 | 674,427,855 | 692,760,708 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 69,796,599 | | | | 69,796,599 | 64,572,709 | | | 3,587,741 | 68,160,450 | 1,636,149 | 5,223,891 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 44,502,095 | | | | 44,502,095 | 17,171,027 | | | 2,074,420 | 19,245,447 | 25,256,649 | 27,331,069 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 795,787,490 | 11,987,294 | | | 807,774,784 | 664,853,734 | | | 25,251,236 | 690,104,970 | 117,669,814 | 130,933,756 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | | | | 148,311 | 148,311 | | | | 148,311 | - | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | | | | 60,450 | 60,450 | | | | 60,450 | - | - |
| මෙවලම් හා උපකරණ | 8,531,315 | 666,588 | | | 9,197,903 | 7,518,628 | | | 472,561 | 7,991,189 | 1,206,713 | 1,012,687 |
| විදුලි උපකරණ | 33,804,548 | 2,339,397 | | | 36,143,944 | 22,942,867 | | | 2,124,342 | 25,067,210 | 11,076,735 | 10,861,680 |
| වාහන | 629,639,107 | | | | 629,639,107 | 501,265,093 | | | 120,054,726 | 621,319,819 | 8,319,288 | 128,374,013 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 106,400,860 | 2,936,618 | | | 109,337,479 | 76,713,209 | | | 8,720,736 | 85,433,945 | 23,903,534 | 29,687,651 |
| කාර්යාලීය උපකරණ | 48,340,683 | 2,450,994 | | | 50,791,677 | 39,255,257 | | | 2,190,728 | 41,445,986 | 9,345,691 | 9,085,425 |
| පරිගණක හා උපාංග | 103,774,214 | 5,883,756 | 311,700 | | 109,346,270 | 86,899,573 | 311,690 | | 5,951,264 | 92,539,147 | 16,807,123 | 16,874,641 |
| විවිධ වත්කම් | 37,013,787 | 393,433 | | | 37,407,220 | 33,926,710 | | | 1,233,078 | 35,159,789 | 2,247,431 | 3,087,076 |
| පෙර නිමැවුම් ව්‍යුහ | 4,938,333 | | | | 4,938,333 | 4,938,333 | | | | 4,938,333 | - | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | | | | 680,300 | 680,300 | | | | 680,300 | - | - |
| **එකතුව** | **3,047,978,828** | **36,439,817** | **311,700** | | **3,084,106,944** | **1,890,853,880** | **311,690** | | **198,388,672** | **2,088,930,862** | **995,176,082** | **1,157,124,947** |

| 10. ජීව විද්‍යාත්මක වත්කම්<br>දෙසැම්බර් 31 දිනට ශේෂය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භක ශේෂය | 7,735,659 | 7,735,659 |
| නැවත වගාකිරීම් හෝ සංවර්ධනය සඳහා දරණ ලද වියදම් | | |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **7,735,659** | **7,735,659** |

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිනතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගතවන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිණාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගතවන බවත් සඳහන් කළ හැකිය. ජීව විද්‍යාත්මක පරිණාමය ගතවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත්, එම කාල පරිච්ඡේදය තුළ සමාන බව උපකල්පනය කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවට අයත් තේක්ක වගාවන් තවම අවුරුදු 9 ක අපරිණත වගාවන් කාණ්ඩයට අයත් වේ. එම වගාවන් පරිණත බවට පත්වන විට ඒ සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැයක් වෙතොත් එම අගය ද ඇතුළුව මුළු අගය අපරිණත ගිණුම්වලින් පරිණත ගිණුම් තුළට මාරුකරනු ලැබේ.

පුලියන්කුලම, මැදවච්චිය, සෙවනපිටිය හා විනීතගම යන ස්ථානවල සංස්ථාව සතු තේක්ක වගාවක් පවත්වාගෙන යනු ලබයි.

| 11. ආයෝජන<br>11.1 ආයෝජන - දිගු කාලීන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය - දිගු කාලීන | | |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 731,832,197 | 731,832,197 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 107,433,487 | 46,821,808 |
| | **839,265,683** | **778,654,005** |
| කොටස්වල ආයෝජනය | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| | **500,000** | **500,000** |
| **එකතුව** | **839,765,683** | **779,154,005** |

| 11.2 ආයෝජනය - කෙටි කාලීන<br>ස්ථාවර තැන්පතුවල ආයෝජනය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| මහජන බැංකුව | 2,355,535,981 | 2,188,897,580 |
| ලංකා බැංකුව | 2,842,070,406 | 1,871,445,945 |
| **එකතුව** | **5,197,606,388** | **4,060,343,525** |

| 12. තොග<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| වෙළඳ බඩු තොගය | 1,292,106,600 | 1,518,825,660 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | (30,009,545) | (39,316,117) |
| | **1,262,097,055** | **1,479,509,543** |
| කෙරීගෙන යන වැඩ | 30,085,278 | 25,590,130 |
| ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස් | 136,413,998 | 148,681,870 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | 96,211,655 | 109,428,517 |
| ඉන්ධන හා තෙල් | 7,022,613 | 8,690,793 |
| ලිපිද්‍රව්‍ය | 20,807,877 | 17,734,076 |
| **එකතුව** | **1,552,638,476** | **1,789,634,929** |

| 12.1 තොග විශ්ලේෂණය<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| රජයේ ඉඩම්වලින් ලද කඳන් | 619,702,269 | 801,355,476 |
| රජයේ ඉඩම්වලින් ලද ඉරුදඬු | 339,021,842 | 352,368,904 |
| ආනයනික ඉරුදඬු | - | 346,990 |
| රජයේ ඉඩම්වලින් ලද සිල්පර | 8,134,820 | 1,054,597 |
| පුද්ගලික ඉඩම්වලින් ලද කඳන් | - | 5,628 |
| රජයේ ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු | 38,528,528 | 31,701,917 |
| පුද්ගලික ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු | - | 2,767,965 |
| මංසල විකුණුම් | - | 1,565,736 |
| වෙනත් | 16,272,920 | 17,324,638 |
| ගෘහභාණ්ඩ | 270,446,221 | 310,333,809 |
| **එකතුව** | **1,292,106,600** | **1,518,825,660** |

| 13. වෙළඳ සහ වෙනත් ණයගැතියෝ<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **වෙළඳ ණයගැතියෝ** | **1,241,797,019** | **966,058,091** |
| අඩමාන ණය වෙන්කිරීම් | (288,468,445) | (286,629,589) |
| | **953,328,575** | **679,428,502** |
| **කාර්ය මණ්ඩල ණයගැතියෝ** 13.2 | **393,946,407** | **377,305,324** |
| **වෙනත් ණයගැතියෝ** 13.1 | **34,620,293** | **41,625,155** |
| තැන්පත් හා පූර්ව ගෙවීම් | | |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | 752,018 | 2,210,439 |
| පූර්ව ගෙවීම් ආනයන | - | 100,398 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | 445,675 | 8,497,437 |
| දැව සැපයීමේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 17,674,403 | 21,340,342 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොළිය | 234,003,871 | 211,463,506 |
| ආපසු හරවා යැවූ චෙක්පත් | 4,791 | 4,791 |
| කතරගම අෂ්ඨපල අරමුදල | 674,600 | 737,400 |
| උසාවි තැන්පත් | 82,316 | 82,316 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 1,731,821 | 1,731,821 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 100,620,163 | 92,920,914 |
| ESCAMP ව්‍යාපෘතිය | | 1,445,583 |
| **එකතුව** | **1,737,884,932** | **1,438,893,929** |

| 13.1 වෙනත් ණයගැතියෝ<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| විවිධ ණයගැතියෝ | 4,783,576 | 2,291,468 |
| පොදු තැන්පත් | 30,203,336 | 39,700,307 |
| වෙන් කිරීම් | (366,620) | (366,620) |
| **එකතුව** | **34,620,293** | **41,625,155** |

| 13.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **කාර්ය මණ්ඩල ණය** | | |
| වාහන ණය | 30,327,991 | 31,309,713 |
| ආපදා ණය | 278,871,964 | 298,625,502 |
| විදුලි උපකරණ ණය | 21,820 | 21,820 |
| යතුරුපැදි ණය | 1,816,546 | 1,420,786 |
| ලැප්ටොප් පරිගණක ණය | 24,215,944 | 19,944,464 |
| ගෘහභාණ්ඩ ණය | 5,186,182 | 4,281,642 |
| | **340,440,446** | **355,603,926** |
| **අත්තිකාරම් හා වෙනත් ණය** | | |
| වැටුප් අත්තිකාරම් | 8,500 | 10,000 |
| ගමන් වියදම් අත්තිකාරම් | 575 | 8,000 |
| උත්සව අත්තිකාරම් | 3,217,710 | 3,325,192 |
| අභ්‍යන්තර හරපත් | 49,785 | 153,145 |
| සේවක අයකිරීම් | 4,976,741 | |
| වැඩබිම් ශුද්ධ කිරීම වෙනුවෙන් ලැබිය යුතු වියදම් | 33,374,639 | 7,561,816 |
| රෙදිපිළි ණය | 11,878,011 | 10,643,245 |
| | **53,505,961** | **21,701,397** |
| **එකතුව** | **393,946,407** | **377,305,324** |

| 14. මුදල් හා බැංකු ශේෂය<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| අතැති මුදල් | 1,291,380 | 1,256,500 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම | 46,107,255 | 79,939,206 |
| ලංකා බැංකුව - කාලීන තැන්පතු | 30,314,528 | 141,994,769 |
| ලංකා බැංකුව - හරපත් | 200,000 | 200,000 |
| **එකතුව** | **77,913,163** | **223,390,474** |

| 15. දායක ප්‍රාග්ධනය<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **එකතුව** | **41,503,668** | **41,503,668** |

| 16. සේවක ණය චක්‍රීය අරමුදල<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| වසර ආරම්භක ශේෂය | 512,554,753 | 494,093,306 |
| සේවක ණය පොළී ලැබීම් | 16,163,435 | 18,461,447 |
| වසර අවසාන මුළු ශේෂය | **528,718,188** | **512,554,753** |
| | | |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය | 340,418,626 | 343,482,218 |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල | **188,299,562** | **169,072,536** |

| 17. විශ්‍රාමික පාරිතෝෂිකය<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ | | |
| වසර ආරම්භක ශේෂය | 406,440,553 | 253,071,791 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 37,241,876 | 19,708,350 |
| වසර සඳහා පොළිය | 39,692,326 | 28,451,670 |
| වර්ෂය තුළ ඌණතාවය හෝ (අතිරික්තය) | 333,304,478 | 164,697,250 |
| වර්ෂය තුළ ගෙවීම් | (43,840,292) | (59,488,508) |
| **වසර අවසාන ශේෂය** | **772,838,940** | **406,440,553** |
| | | |
| **ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ.** | | |
| මෙම වසර සඳහා ප්‍රතිපාදන | 37,214,876 | 19,708,350 |
| වසර සඳහා පොළිය | 39,692,326 | 28,451,670 |
| **ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගය** | **76,934,201** | **48,160,020** |
| | | |
| විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ. | | |
| වර්ෂය සඳහා (අතිරික්තය) / හෝ ඌණතාවය | 333,304,478 | 164,697,250 |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණය** | **333,304,478** | **164,697,250** |

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ගණනයේ දී 1983 අංක 12 දරන විශ්‍රාමික පාරිතෝෂික පනතට අනුකූලව අඛණ්ඩව අවුරුදු 5 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක්කරන ලදී. වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන,

| | 2024 | 2023 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 11.11% | 14.10% |
| අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය | 9.88% | 4.45% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 5.54% | 6.83% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | 60 | 60 |

| 18. බදුකරණය<br>දෙසැම්බර් 31 දිනට ශේෂය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| වසර ආරම්භක ගෙවිය යුතු ආදායම් බදු ශේෂය | 24,375,301 | 109,777,488 |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (26,360,328) | |
| වර්ෂය තුළ ගෙවීම් | (324,375,301) | (270,278,278) |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 171,084,221 | 184,876,090 |
| වසර අවසාන ශේෂය | **(155,276,107)** | **24,375,301** |

| 19. ණය හිමියෝ සහ උපචිත වියදම්<br>දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 20,955,762 | 17,912,725 |
| සේවක භාරකාර අරමුදල | 2,515,552 | 2,060,784 |
| උපචිත වියදම් | 486,490,538 | 77,169,571 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 23,881,107 | 19,046,421 |
| ඇප තැන්පත් - කාර්ය මණ්ඩලය හැර | 129,619,705 | 118,498,103 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 4,000,000 | 4,000,000 |
| රඳවාගත් මුදල් | 11,901,136 | 13,522,126 |
| වෙනත් ණයහිමියෝ | 166,162,147 | 224,597,457 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 803,713,608 | 357,302,771 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 50,072,609 | 50,072,609 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 112,802 | 112,802 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 15,996,620 | 13,858,116 |
| එකතුකළ අගය මත බදු | 23,212,472 | 46,461,689 |
| එකතුව | **1,738,634,058** | **944,615,173** |

| 20. ආශ්‍රිත පාර්ශවයන් සමග ගණුදෙනු |
|---|

* රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංස්ථාවට දැව හෙළීම සඳහා වනවගා නිදහස් කිරීමේදී ජාතික කළමනාකරණ සැලැස්මට අනුව සිදුකරයි.

| | වර්ග අඩි ගණන | කුලී මුදල (රු.) |
|---|---|---|
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 22,040 | 550,000 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6,480 | 300,000 |

මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනුවල ශේෂයන් පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | **2024**<br>රු. | **2023**<br>රු. |
|---|---|---|
| **ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු** | | |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 803,713,608 | 357,302,771 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 50,072,609 | 50,072,609 |
| | **853,786,216** | **407,375,379** |
| | | |
| **ආශ්‍රිත පාර්ශවයනගෙන් ලැබිය යුතු** | | |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 100,620,163 | 92,920,914 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | 10,813,186 |
| ESCAMP ව්‍යාපෘතිය | - | 1,445,583 |
| පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | 1,731,821 | 1,731,821 |
| | **102,351,984** | **106,911,504** |

| 21. පොළී දරන වගකීම්<br>මූල්‍ය කල්බදු | **2024**<br>**Rs.** | **2023**<br>**Rs.** |
|---|---|---|
| **වසර ආරම්භක ශේෂය** | 7,874,492 | 14,501,583 |
| නැවත ගෙවීම් | (4,321,899) | (6,627,091) |
| | **3,552,593** | **7,874,492** |
| අවිනිශ්චිත කල්බදු පොළිය | (183,154) | (698,607) |
| **වසර අවසාන ශේෂය** | **3,369,439** | **7,175,885** |
| | | |
| පොළී දරන වගකීම් - ජංගම | 3,369,439 | 3,520,107 |
| පොළී දරන වගකීම් - ජංගම නොවන | - | 3,655,778 |
| | **3,369,439** | **7,175,885** |

# මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

## A

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන නිශ්චිත මූලධර්ම, පදනම්, සම්මුතීන් හා නීතිරීති.

### ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කමක ක්ෂය කළ හැකි අගය ක්‍රමානුකූලව එහි ප්‍රයෝජනවත් ජීව කාලය පුරා බෙදාවෙන් කිරීම.

### උපචිත පදනම

ලැබීම් හෝ ගෙවීම් කාලය නොසලකා ආදායම් සහ පිරිවැය එකිනෙක සමඟ ගැලපුම් කිරීමේ මූලධර්මය වේ.

## B

### ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක / ප්‍රාණවත් සතෙකු හෝ ශාකයක්.

## C

### මුදල් සහ මුදල් සමාන අයිතම

මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත ද්‍රවශීලි ආයෝජන

### වත්මන් / ජංගම අනුපාතය

ජංගම වත්කම් ජංගම වගකීම් වලින් බෙදනු ලැබේ.

## D

### විලම්භිත බදු

වර්තමාන ගිණුම්කරන ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්තිවලින් වෙනස්වීම නිසා අනාගතයේ දී ඇතිවිය හැකි වත්කම් හෝ වගකීම් වේ.

### ක්ෂයවීම

වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට වඩාත් ක්‍රමානුකූලව බෙදාහැරීම.

# මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

## F

**සාධාරණ වටිනාකම**

වර්තමාන වෙළෙඳපොළ තත්ත්වය යටතේ මිනුම් දිනයේ දී වත්කම් හෝ වගකීම් විකිණීම සඳහා වෙළෙඳපොළ පාර්ශවකරුවන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කම් හෝ වගකීම් හුවමාරු වන අගය සාධාරණ අගය ලෙස උපකල්පනය කරයි.

**මූල්‍ය කල්බදු**

මූල්‍ය කල්බදු යනු වත්කම්වල හිමිකාරිත්වය (කල්බදු ගැණුම්කරු) සඳහා සියලු අවදානම් සහ ප්‍රතිලාභ මාරු වන කල්බදු ක්‍රමවේදයකි. නීත්‍යානුකූල අයිතිය ගිවිසුම අවසානයේ මාරුවීම හෝ නොවීම සිදුවිය හැක.

## G

**තෝලනය**

භාවිතයේ යොදවා ඇති ප්‍රාග්ධනයට ණය ගැනීම් අනුපාතය.

## R

**ආදායම් / අයභාරය සංචිත**

ආයෝජන සඳහා ගොඩනඟාගන්නා ලද සංචිත වේ.

**වත්කම් මත ප්‍රතිලාභ (ROA)**

ශුද්ධ ආදායම සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, එය ලාභ හැකියාව මැනීමේ සහ අභ්‍යන්තර කර්මාන්ත කාර්ය සාධනය සංසන්දනයේ පදනමක් ලෙස භාවිතා කරයි.

**භාවිතයට ඇති අයිතිය**

භාවිතයට ඇති අයිතිය යනු කල්බදු ජීවිත කාලය පුරාවට ම වත්කමක් භාවිතා කිරීමට කල්බදු ගැනුම්කරුට ඇති අයිතියයි.

වත්කම් ගණනය කරනු ලබන්නේ කල්බදු වගකීම්වල ආරම්භක මුදලට, බදු ආරම්භක දිනයට පෙර බදුකරුට ලබා දී ඇති ඕනෑම කල්බදු ගෙවීම් එකතු කළ යුතු අතර, එහි කිසියම් ආරම්භක ඍජු පිරිවැයක් දැරීම, ලැබුණු සියලුම කල්බදු දිරි දීමනා/සහනයන් ඉවත් කිරීම.

**සම්බන්ධිත පාර්ශවයන්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ආයතනයට සම්බන්ධ පුද්ගලයෙකු හෝ ආයතනයක්.

## V

**අගය එකතු කිරීම**

සංස්ථාවේ ක්‍රියාකාරකම් සහ එය බෙදාහැරීම මගින් ජනනය කරන ලද සම්පත් ප්‍රමාණය.




**රාජ්‍ය දැව සංස්ථාව**

අංක 82, ''සම්පත්පාය'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකා.

**அரசாங்க மரக் கூட்டுத்தாபனம்**

இலக்கம் 82, “சம்பத்பாய”, ராஜமல்வத்த வீதி, பத்தரமுல்லை, இலங்கை.

**STATE TIMBER CORPORTATION**

No. 82, “Sampathpaya”, Rajamalwatta Road, Battaramulla, Sri Lanka.

+94 11 2866601 - 5   +94 11 2866623   www.timco.lk